# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බිනර පුර අටවක පෝ දද, රාජ්‍ය වර්ෂ 2020 අගෝස්තු 25 අඟහරුවාදා, BUDUSARANA, TUESDAY AUGUST 25, 2020


55 වැනි කාණ්ඩය, 11 වැනි පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 20 මිල රු. 40.00




## භද්‍රවර්ගික කුමරුන් පැවිදි වීම

(විස්තරය 16 පිටුව)

සිතුවම - හර්ෂ ගුණවර්ධන



# දිවිහිමි කොට සුරැකිය යුතු සාමණේර දස සීලය

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

පළමුව දැක්වෙනුයේ නමස්කාරය යි. ‘අවිදු අඳුර දුරලා සිවුසස්දහම් (චතුරාර්ය සත්‍ය ධර්මය) අවබෝධ කළ නිසා’ අප තථාගතයන් වහන්සේට ‘නමෝ’ යැයි කියා වන්දනා කරන ලද්දේ සාතාගිර නැමති යක්ෂ සෙන්පතියා විසිනි.

‘තෘෂ්ණා මානාදී සියලු ම කෙලෙස් ධර්මයන් මුලිනුපුටා දැමූ නිසා’ අප අමාමෑණියන් වහන්සේට ‘තස්ස’ යැයි කියා නමස්කාර කරන ලද්දේ වේපචිත්ති අසුර සෙන්පතියා විසිනි.

‘සියලු රාගාදී කෙලෙස් ධර්මයන් නසා භග ධර්මයන්ගෙන් පිරිපුන් වූ නිසා’ අප භාග්‍යවතුන් වහන්සේට ‘භගවතෝ’ යැයි කියා නමස්කාර කරන ලද්දේ සිවුවරම් රජදරුවන් විසිනි.

‘දෙව් මිනිසුන්ගේ සිව්පස ලාභය ලැබීමට සුදුසු එකම අසහාය උතුමන් වහන්සේ වන නිසා’ තථාගතයන් වහන්සේට ‘අරහතෝ’ යැයි කියා නමස්කාර කරන ලද්දේ දෙ දෙව්ලොවට අධිපති ශක්‍ර දේවේන්ද්‍රයා විසිනි.

‘සිවුසස් දහම හෙවත් චතුරාර්ය සත්‍ය ධර්මය තමන් වහන්සේ තනිව ම අවබෝධ කරගත් නිසා’ බුදුපියාණන් වහන්සේට ‘සම්මා සම්බුද්ධස්ස’ යැයි කියා නමස්කාර කරන ලද්දේ සහම්පතී මහා බ්‍රහ්මයා විසිනි.

### සරණාගමනං (සරණාගමනය)

**බුද්ධං සරණං ගච්ඡාමි**
මම පළමුව බුදුරජාණන් වහන්සේ සරණ යමි.
**ධම්මං සරණං ගච්ඡාමි**
මම පළමුව ධර්ම රත්නයේ සරණ යමි)
**සංඝං සරණං ගච්ඡාමි**
මම පළමුව සංඝ රත්නයේ සරණ යමි.
**දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
මම දෙවනුව ද බුදුරජාණන් වහන්සේ සරණ යමි.
**දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
මම දෙවනුව ද ධර්ම රත්නයේ සරණ යමි.
**දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි**
මම දෙවනුව ද සංඝ රත්නයේ සරණ යමි.
**තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
මම තෙවනුව ද බුදුරජාණන් වහන්සේ සරණ යමි.
**තතියම්පිධම්මං සරණං ගච්ඡාමි**



නිහිළුව
සිරි ධම්මානන්ද මහ පිරිවෙන්පති
දර්ශනපති රාජකීය පණ්ඩිත ත්‍රිපිටකාචාර්ය
**හත්තොටුවේ ඉන්දරතන හිමි**

මම තෙවනුව ද ධර්ම රත්නයේ සරණ යමි.
**තතියම්පිසංඝං සරණං ගච්ඡාමි**
මම තෙවනුව ද සංඝ රත්නයේ සරණ යමි.

### සාමණේර ශික්ෂාපද දහය

**පාණාතිපාතා වේරමණී සික්ඛාපදං.**
පර පණ (අන් සත්ත්වයන්ගේ ප්‍රාණය) නැසීමෙන්, වැනසීමෙන් වැළැකීමේ ශික්ෂා පදය



**අදින්නාදානා වේරමණී සික්ඛාපදං.**
තමාට නුදුන් දේ (අනුන්ගේ දේ) ගැනීමෙන් වැළැකීමේ ශික්ෂා පදය
**අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං.**
බඹසර වාසයෙන් වෙන්ව සිටීමෙන් මෛථුන ධර්මයෙහි යෙදීමෙන් වැළකීමේ ශික්ෂා පදය
**මුසාවාදා වේරමණී සික්ඛාපදං.**
බොරුවෙන්, මුසාවෙන් වැළකීමේ ශික්ෂා පදය
**සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං.**
මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙන් (මත්ද්‍රව්‍ය භාවිතයෙන්) වැළකීමේ ශික්ෂා පදය
**විකාලභෝජනා වේරමණී සික්ඛාපදං.**
ඉර අවරට ගිය පසු ආහාර ගැනීමෙන් වැළකීමේ ශික්ෂා පදය
**නච්චගීතවාදිත විසූකදස්සනා වේරමණී සික්ඛාපදං.**
නැටුම්, ගැයුම්, වැයුම්, දැගලීම් ආදී විසූක දර්ශන බැලීමෙන් වැළකීමේ ශික්ෂා පදය
**මාලාගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං.**
මල්, සුවඳ දේවල් විලවුන් වර්ග සිරුරේ පැළඳීමෙන් හා ගැමෙන් වැළකීමේ ශික්ෂා පදය
**උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං.**
අධි සුඛෝපභෝගී උසසුන් මහසුන්වල හිඳීමෙන් වැළකීමේ ශික්ෂා පදය
**ජාතරූප රජත පඩිග්ගහණා වේරමණී සික්ඛාපදං.**
රන්, රිදී, මසු කහවණු පිළිගැනීමෙන් වැළකීමේ ශික්ෂා පදය යන ශික්ෂා පද දහය දිවිහිමි කොට සමාදන් වෙමි.

සාමණේරයන් වහන්සේලාත්, සාමණේරියන් වහන්සේලාත් පැවිදි භාවයට පත්වන දිනයේ ස්වකීය උපාධ්‍යායන් වහන්සේ වෙතින් සමාදන් වනුයේත් සාමණේර අවදියේ දිවිහිමි කොට සුරකිනුයේත් මෙම සාමණේර දස සීලය යි. ශික්ෂා පද දහය ම එකට කැටිකොට සමාදන්වීම මෙම සීලයේ ඇති විශේෂ ත්වයයි. එහි දී එක ශික්ෂා පදයක් කැඩුණහොත් සමාදන් වූ සියලු ශික්ෂා පද කැඩුණු සේ සැලැකේ.

එකට කැටිකර තදකර බඳින ලද දර මිටියෙන් එක දර කැබැල්ලක් ගතහොත් දරමිටිය ම ලිහිල් ව ගිලිහෙන බැවිනි.

ගිහි දස සීලයේ දී එක් එක් ශික්ෂා පදය වෙන වෙන ම සමාදන් වෙයි. එනිසා එහිදී සෑම ශික්ෂා පදයක් පාසා ම ‘සමාදියාමි’ යන පදය අවසානයට යොදනු ලැබේ. උක්ත දස සීලයේ එම පදය යොදා නැත්තේ මෙය ගිහි දස සීලය නොව පැවිදි පක්ෂයට අදාළ සාමණේර දස සීලය වන බැවිනි.

## තෙරුවන් වැඳීම ඇතුළත් භාවනා ගාථා



නමාමි බුද්ධං ගුණ සාගරන්තං
සත්තා සදා හොන්තු සුඛී දූගන්ධෝ
කායො ජිගුච්ඡෝ සකලො දූගන්ධො
ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

ගුණයට සයුරු වූ බුදුරදුන් වඳිමි. සත්ත්වයෝ හැම කල්හි සුවපත් වෙත්වා! අවෛරී වෙත්වා!

කය පිළිකුල් සහගත ය. මුලුමනින් ම දුගඳ ය. මම ද සියල්ලෝ ද මරණයට පත් වෙති.

නමාමි ධම්මං ගුණ සාගරන්තං
සත්තා සදා හොන්තු සුඛී දූගන්ධෝ
කායො ජිගුච්ඡෝ සකලො දූගන්ධො
ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

බුදුරදුන් දෙසූ දහම වඳිමි. සත්ත්වයෝ හැම කල්හි සුවපත් වෙත්වා! අවෛරී වෙත්වා!

කය පිළිකුල් සහගත ය. මුලුමනින් ම දුගඳ ය. මම ද සියල්ලෝ ද මරණයට පත් වෙති.

නමාමි සංඝං ගුණ සාගරන්තං
සත්තා සදා හොන්තු සුඛී දූගන්ධෝ
කායො ජිගුච්ඡෝ සකලො දූගන්ධො
ගච්ඡන්ති සබ්බේ මරණං අහං ච

බුදුරදුන් ගේ ශ්‍රාවක වූ සංඝ රත්නයට වඳිමි. සත්ත්වයෝ හැම කල්හි සුවපත් වෙත්වා! අවෛරී වෙත්වා! කය පිළිකුල් සහගත ය. මුලුමනින් ම දුගඳ ය. මම ද සියල්ලෝ ද මරණයට පත් වෙති.


# මිනිස්කමේ වටිනාකම වටහාගන්න



බිනර පුර අටවක පෝදා

## දම් දෙසුම





**බෙංගමුවේ නාලක අනු නා හිමි**

**සුකරානි අසාධූනි
අත්තනෝ අහිතානිච
යං වේ හිතංච සාධුංච
තං වේ පරම දුක්කරං**

තමන්ට අහිතකර වූ ද, අයහපත් වූ ද දේ කිරීම පහසුයි. තමන්ට හිතකර වූ ද, යහපත් වූ ද දේ කිරීම අපහසු ය.

**සැමට ම පළමුව යහපත් මිනිසකු වීම අවශ්‍ය වේ. උසස් මනසක් ඇති නිසා ම මනුස්ස යන නම යෙදී ඇත. දිව්‍ය බ්‍රහ්ම ආදීන්ට මෙන් ම මිනිසුන් නොවන වෙනත් සත්වයන්ට ද මිනිසාට තරම් උසස් මනසක් ඇති කරගත නොහැක.**

මනසේ උසස් බව වටහා නොගෙන කටයුතු කරන විට මිනිසා නොමිනිසෙකු වෙයි. අමනුෂ්‍යයෙක් වෙයි. මිනිස්කමේ වටිනාකම වටහා ගැනීමට හොඳම ආදර්ශය බුද්ධ චරිතයයි.

බෞද්ධයන් පිළිගන්නේ මුළු මහත් ලෝක ධාතුවෙහි ම ශ්‍රේෂ්ටතම පුද්ගලයා වනුයේ බුදුරජාණන් වහන්සේ වන බවයි. නූතන ලෝකයේ බොහෝ නුවණැත්තෝ ද එය එසේ පිළිගනිති. මීට වසර කිහිපයකට පෙර එංගලන්තයේ දී උගත් බුද්ධිමත් කණ්ඩායමක් එක්ව මෙතෙක් ලෝකයේ බිහි වූ ශ්‍රේෂ්ටතම මිනිසා කවුරුන්දැයි පරීක්ෂණයක් කළහ. ඔවුන්ගේ අවසාන තීරණය වූයේ මෙතෙක් ලොව බිහි වූ ශ්‍රේෂ්ටතම උත්තමයා ගෞතම බුදුරජාණන් වහන්සේ බවයි.

බුදු කෙනෙකු විය හැක්කේ මිනිසෙකුට පමණි. දෙවියෙකුට, බඹෙකුට හෝ වෙනත් කිසිදු කෙනෙකුට බුදු විය නොහැක. මේ කරුණ අනුව ද මිනිසත්කමේ ඇති වැදගත්කම මොනවට පැහැදිලි වෙයි. සර්වඥ යනු ද බුදුරදුන්ට නමකි. එහි තේරුම සියල්ල දැනගත් තැනැත්තා යනුයි. එසේ සියල්ල දැන ගැනීමට පාදක වනුයේ ද මිනිසත් බවයි.

**කිච්ඡෝ මනුස්ස පටිලාභෝ
කිච්ඡං මච්චාන ජීවිතං
කිච්ඡං සද්ධම්ම සවනං
කිච්ඡෝ බුද්ධානං උප්පාදෝ**

යන බුදු වදනට අනුව මිනිසත් බව ලැබීම අමාරු දෙයකි. මිනිසුන් ලෙස ජීවත්වීම ද එසේ ම ය. සද්ධර්මය ශ්‍රවණය කිරීමට ලැබීම ද අමාරු දෙයකි. බුදු කෙනෙකු පහළ වීම ද එසේ ම අමාරු දුර්ලභ කරුණකි. මිනිසෙකු වී ඉපදීම කොතරම් දුර්ලභ ද යන්න බුදුන් වහන්සේ උපමාවකින් පෙන්වා දී ඇත. "කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බැලීම වැනි ය." යනු ඒ උපමාවයි. ගොවියා සී සාන නගුල කැඩුණු විට එය ඉවත දමයි. විය ගහේ කැබලි දෙක ඇළට වැටී ඇළෙන් දෙළටත්, දෙළෙන් ගඟටත්, ගඟෙන් මුහුදටත් පාවී යයි. එම කැබලි දෙක මුහුදේ පා වෙමින් තිබිය දී ,කිසියම් විටෙක දී කැබලි දෙක එක් වී සිදුරක් සෑදෙයි. එවිට අවුරුදු 100 ට වරක් අහස දෙස බලන එක් ඇසක් ඇති කැස්බෑවෙකුට විය ගසේ කැබලි දෙක එකට එක් වී හැදුණු සිදුරෙන් අහස බැලීමට හැකිවීම වැනි අතිශය අමාරු දුර්ලභ කරුණක් ලෙස මිනිසත් බව ලැබීම විග්‍රහ කර ඇත. මෙහි දී වැදගත් වන්නේ මිනිසා තුළ තිබිය යුතු මනුස්සකමයි. මනුස්සකම නැති විට කවරෙකු වුවත් වැඩක් නැත. මිනිස්කම නැති බෞද්ධයා සැබෑ බෞද්ධයෙකු නොවේ. මිනිස්කම නැති වෙනත් ආගමිකයෝ ද සැබෑ මනුස්සයෝ නොවෙති. දේශපාලකයෙකු, නීතිඥයෙකු, වෛද්‍යවරයෙකු, විද්‍යාඥයෙකු හෝ වෙනත් කවරෙකු වුවත් මිනිස්කම් නොමැති නම් කිසිදු වටිනාකමක් නොමැත. ඇතැම් අන්තවාදීන් ආගම වෙනුවෙන් මිනිසුන් මැරීම මෙන් ම තම ජීවිතය විනාශකර ගැනීම ද ස්වර්ගයට යන මගක් ලෙස උගන්වන්නේත්, ඒ අනුව ක්‍රියා කරන්නේත් මිනිස්කම ආගමට යට කිරීම නිසයි. එවැන්නෝ මුළු මහත් මිනිස් වර්ගයාට ම නිගා කරන්නෝ වෙති. කවරම දෙයක් නමුත් ක්‍රියාත්මක කළ යුත්තේ මනුෂ්‍යත්වය මත පිහිටා ය. සැබෑ මිනිසා හැම දේකට ම වඩා මිනිස්කම අගය කළ යුතු ය. විශේෂයෙන් තරුණ වයස ආවේගශීලී සිතක් ඇති කාලයකි. එබැවින් එම තරුණ වයසේ දී මිනිස්කම් මත පිහිටා ක්‍රියා කිරීමට යොමු වුණොත් කිසිදක ඔහු සමාජයට අහිතකර කෙනෙක් නොවෙන්නේ ය.

> ගොවියා සී සාන නඟුල කැඩුණු විට එය ඉවත දමයි. විය ගහේ කැබලි දෙක ඇළට වැටී ඇළෙන් දෙළටත්, දෙළෙන් ගඟටත්, ගඟෙන් මුහුදටත් පාවී යයි. එම කැබලි දෙක මුහුදේ පා වෙමින් තිබිය දී ,කිසියම් විටෙක දී කැබලි දෙක එක් වී සිදුරක් සෑදෙයි. එවිට අවුරුදු 100 ට වරක් අහස දෙස බලන එක් ඇසක් ඇති කැස්බෑවෙකුට විය ගසේ කැබලි දෙක එකට එක් වී හැදුණු සිදුරෙන් අහස බැලීමට හැකිවීම වැනි අතිශය අමාරු දුර්ලභ කරුණක් ලෙස මිනිසත් බව ලැබීම විග්‍රහ කර ඇත.

මායා, ඉන්කා, රතු ඉන්දියන්, ඇබෝජිනීස් යන ශිෂ්ටාචාර මනුෂ්‍යත්වය පදනම් කරගෙන පැවතුනු ඒවා ය. ඔවුහු හැම කෙනෙක් ම ගහ කොළට, ස්වභාව ධර්මයට ඇලුම් කළහ. එහෙත් ඇමරිකානුවන්, යුරෝපීය ජාතීන්, ඕස්ට්‍රේලියාවට ගිය ඉංග්‍රීසිහු ද එම ශිෂ්ටාචාර විනාශ කළහ. වසර දස දහස් ගණනකට පෙර පැවතුණැයි පිළිගනු ලබන මොහෙන්ජෝදාරෝ, හරප්පා ශිෂ්ටාචාරයේ නටබුන් අද ඇතත් එම ශිෂ්ටාචාරය නොමැත. එසේ වී ඇත්තේ මනුෂ්‍යත්වය නොතකා ක්‍රියා කළ මිනිසුන්ගේ ක්‍රියාකාරකම් නිසා යැයි සිතිය හැකි ය. අද ලෝකයේ නොනැසී එක දිගට පැවත එන ශිෂ්ටාචාර දෙකක් ඇත. එකක් චීනයේ චීන ශිෂ්ටාචාරයයි. අනෙක සිංහල බෞද්ධ ශිෂ්ටාචාරයයි. අද බටහිර ජාතීහු මේ ශිෂ්ටාචාර දෙකටම වෛර කරති. ඔවුන්ට අවශ්‍ය වනුයේ ශිෂ්ටාචාර විනාශ කර නටබුන් සුරැකීමටයි. ඕස්ට්‍රේලියාවේ ඇබෝජිනිස්වරු හා ඇමරිකාවේ රතු ඉන්දියානුවන් අද ඒ තත්ත්වයෙන් සලකනු ලබයි. අපට අවශ්‍ය වනුයේ අපේ මනුෂ්‍යත්වය පදනම් කරගත් ඒ උතුම් ශිෂ්ටාචාරය යි. අප තෝරාගත යුත්තේ නූතන බොහෝ දෙනා ඇබ්බැහි වී සිටින පහසු ජීවන ප්‍රතිපදාව නොව සම්මා ආජීවය හෙවත් යහපත් දිවි පෙවෙතයි. සමහරවිට එය දුෂ්කර විය හැකි ය.

මිනිසත්කමේ ප්‍රමුඛ අරමුණ විය යුත්තේ පහසු දේ කිරීම නොව ප්‍රයෝජනවත් හා වැදගත් දේ කිරීමයි. ත්‍රිරෝද රථ රැකියාවට වඩා ගොවිතැන් බත් කිරීම කෙතරම් වැඩ දායක ද? එහෙත් අපහසු යැයි කියා ගොවිතැන් අතහැර දමා ත්‍රිරෝද රථ රැකියාවට හෝ ගාමන්ට් රැකියාවට හෝ යොමුවන තරුණයන් අද බොහෝ වෙති. පහසු දේ ම නොව මනුෂ්‍යත්වය වැඩෙන ඊට වැදගත්කමක් දෙන දේ කිරීමට මනුෂ්‍යත්වය අගයන තරුණයන් සිතට ගත යුතු ය.

ජාතේනහි මච්චේන කත්තබ්බං
කුසලං බහුං

උපන් මිනිසා විසින් බොහෝ කුසල් කළ යුතු ය.



# මරණයට නොබියව මුහුණ දීමට...

**අංගුත්තර නිකායේ දුක නිපාතයේ ආසා වග්ගයේ පළමු සූත්‍රයෙහි දැක්වෙන පරිදි ජීවිතාශාව මෙන් ම ලාභයට ඇති ආශාවත් පහසුවෙන් බැහැර කළ නොහැකි යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. මෙයින් පළමු වැන්න මිනිසා ඇතුලු සියලු ජීවීන්ට ම පොදු ධර්මතාව වේ. මිනිසා තුළ පවතින සහජාශාවන් අතුරින් ජීවත්වීමට ඇති කැමැත්ත (ජීවිතුකාම) ප්‍රධාන වේ.**


එහෙත් මෙම සහජ තත්ත්වය අවබෝධයෙන් යුතුව ක්‍රියාවට නැංවිය යුත්තකි. කෙනෙකු තුළ පවතින ජීවත් වීමේ සහජාශය ජීවිත මදයක් දක්වා වර්ධනය විය හැකිය. එවිට එම තැනැත්තාට නොමැරෙන අයෙකු සේ ජීවත් වීමට අවශ්‍ය වේ. මහලු විය පිළිකුල් සහගත දෙයක් සේ දකී. මරණයට බිය වීම සියලුම ජීවීන්ට පොදු ධර්මතාවකි. එසේම මරණය දුක්ඛදායක අත්දැකීමකි. එයට අකමැති වන්නේ දුක් විඳීමට ඇති අකැමැත්ත හේතුවෙන් ය. මේ අනුව ජීවිතාශය සමග නොමැරී සිටීමේ කැමැත්තත් දුක පිළිකුල් කිරීමත් බැඳී පවතී.

මිනිසාගේ ඒකායන අරමුණ දිගුකලක් ජීවත්වීමට ය. එබැවින් ජීවිතය හා බැඳී පවතින කැමැත්ත අතිශය ප්‍රබල අභිප්‍රේරණයකි. මිනිසා සියල්ල සිදු කරන්නේ ජීවත්වීම උදෙසා ය. ජීවිතාශය පහසුවෙන් බැහැර කළ නොහැකි දෙයකැයි බුදුරදුන් වදාළේ ඒ හෙයින් ය. ජීවිතාශය විසින් මිනිසා මෙහෙයවනු ලැබේ. සැම මිනිසෙකුගේ ම ඒකායන අරමුණ හැකිතාක් පහසුකම් සිහිත ව දිගුකලක් ජීවත්වීම ය. එයට බාධකවන සියල්ල සමග මිනිසා සටන් කරයි. තම පැවැත්මට බාධකවන භෞතික මෙන් ම, අභෞතික සියල්ල බැහැර කිරීම හෝ විනාශ කිරීම ඒකායන අභිලාසය වේ. ජීවිතාශය පොදු ධර්මතාවක් බව වටහා නොගන්නා පුද්ගලයා තුළ ආත්මාර්ථකාමිත්වය වර්ධනය වේ. තමා පමණක්ය යන සාවද්‍ය දෘෂ්ටිය ඇති වන්නේ ආත්මාර්ථකාමිත්වය හේතුවෙන් ය. එහෙත් එය විශ්ව සාධාරණ පොදු ධර්මතාවක් ලෙස දකින තැනැත්තා ආත්මාර්ථකාමිත්වයෙන් බොහෝ දුරට මිඳුණු අයෙකු වේ.

> කෙනෙකු තුළ පවතින ජීවත් වීමේ සහජාශය ජීවිත මදයක් දක්වා වර්ධනය විය හැකිය. එවිට එම තැනැත්තාට නොමැරෙන අයෙකු සේ ජීවත් වීමට අවශ්‍ය වේ. මහලු විය පිළිකුල් සහගත දෙයක් සේ දකී. මරණයට බිය වීම සියලුම ජීවීන්ට පොදු ධර්මතාවකි.

තමා අන්‍යයන්ගෙන් වෙන්කොට සැලකීම ආත්මාර්ථකාමී පුද්ගලයාගේ ලක්ෂණය වේ. ආත්මාර්ථකාමිත්වය අන්තර්පුද්ගල ගැටුම් ඇතිවීමට පමණක් ම නොව ආධ්‍යාත්මික විමුක්තිය සම්බන්ධයෙන් ද එහි විශාල බලපෑමක් තිබේ. තමා සමස්තයෙන් වෙන් නොකර සමස්තයේ ම කොටසක් ලෙස දැකීම හේතුඵල සම්බන්ධය වටහා ගැනීම වේ. සියල්ල පවතින්නේ හේතුඵල සම්බන්ධතාවකට අනුව යන්න වටහා ගත් පුද්ගලයාට ජීවිතාශය නිසා වන ජීවිතමදය ඇති නොවේ.

ජීවත් වීමට ඇති කැමැත්ත මූලික සහජාශයක් ලෙස සියලුම ජීවීන්ටම පොදු සාධාරණ ධර්මතාවක් වුව ද ලාභ ලැබීමේ සහජාශය මිනිසාට පමණක් ම ආවේණික වූවකි. භෞතික වශයෙන් විවිධ ද්‍රව්‍ය එක් රැස් කිරීමට



කොළඹ විශ්වවිද්‍යාලයේ
බෞද්ධ අධ්‍යයන අංශයේ
අංශාධිපති
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත ආචාර්ය
**උඩුහාවර ආනන්ද හිමි**

මෙන්ම, ඒවා අත්පත් කර ගැනීමට මිනිසා තුළ නොනවතින කැමැත්තක් හා ආශාවක් පවතී. විවිධ ලාභ ප්‍රයෝජන සඳහා පමණක් නොව තනතුරු වරප්‍රසාද හා බලය කෙරෙහි පවතින දෘඪතර ආශාව ද ලාභය මූලික කරගත්තකි. මේ සියල්ලෙන් ම මිනිසා අපේක්ෂා කරන හෝ බලාපොරොත්තුවන යමක් තිබේ. ලාභය උදෙසා මිනිසා විසින් යහපත් ද්‍රව්‍ය මෙන්ම අයහපත් ද්‍රව්‍ය සිදුකරයි. යහපත් ද්‍රව්‍යට වඩා අයහපත් ද්‍රව්‍ය සිදුකිරීම ලාභ ප්‍රයෝජන හා වරප්‍රසාද කෙරෙහි උනන්දුවන පුද්ගලයාගේ ලක්ෂණය වේ. ලාභය උදෙසාම කටයුතු කරන පුද්ගලයා විසින් පංච දුශ්චරිතය ම සිදුකරයි. සිතේ පවතින ලාභාශාව හේතුවෙන් මෙහෙයවෙන ඇතැම් පුද්ගලයන් ආධ්‍යාත්මික විමුක්තිය පිණිස පවතින ක්‍රියාකාරකම් ද ඒ සඳහා උපයෝගී කර ගන්නා අවස්ථා තිබේ. ලාභය සෙවීම අනිකක් බවත්, නිවන් පිළිවෙත අනිකක් බවත් බුදුරදුන් වදාළේ ඒ හෙයිනි. එසේම වීතරාගී උතුමෝ ලාභ කීර්ති ප්‍රසංශා ආදිය හරසුන් දේ යැයි සලකා ඇති අයුරු බුදුරදුන් නාගිත තෙරුන්ට කළ දේශානව ඇතුළත් නාගිත සූත්‍රයෙන් පැහැදිලි වේ. ලාභ ප්‍රයෝජන හා කීර්තිය උදෙසා ආධ්‍යාත්මික බලය භාවිත කරන්න යැයි බුදුරදුන්ගෙන් ඉල්ලා සිටි අවස්ථාවෙහි බුදුරජාණන් වහන්සේ නාගිත තෙරුන් අමතා තමන් වහන්සේ සමග ලාභ ප්‍රයෝජන සම්බන්ධ නොවේවා. යසස ද තමන් වහන්සේ හා සම්බන්ධ නොවේවා යැයි ප්‍රාර්ථනා කරමින් ත්‍රිවිධ විවේක සුවය අපේක්ෂා කරන්නෙකු ලාභ ප්‍රයෝජන, කීර්ති ප්‍රසංශා ආදිය බැහැර කළ යුතු බවත් දේශනා කළහ. මෙහිදී බුදුරදුන් තවදුරටත් දේශනා කොට වදාළේ අනුභව කළ ද්‍රව්‍ය සියල්ල මළ හා මූත්‍ර අවසන්කොට ඇති බවයි. මෙයින් බුදුරදුන් පෙන්වා වදාළේ සිව්පස ලාභය වෙනුවෙන් ගිජුව කටයුතු කරන්නාට ත්‍රිවිධ විවේක සුවය හිමි නොවන බවයි. ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රශංසා උතුම් හා හරවත් දෙයකැයි සිතන ගිහි පැවිදි දෙපක්ෂයට ම මෙම බුද්ධාවවාදය බෙහෙවින් අදාළ වේ.

යසස කීර්තිය හා ලාභ ප්‍රයෝජන ප්‍රාර්ථනා කිරීම මිනිසාගේ සහජාශයක් වන හෙයින් ඒ සඳහා වර්තමාන මිනිසා අනවරත අරගලයක නිරතවෙනු දක්නට ලැබේ. විවිධ තනතුරු හා ලාභ ප්‍රයෝජන ලබා ගැනීමෙහිලා අනේකවිධ වැරදි පිළිවෙත් අනුගමනය කරනු ලැබේ.

ලාභ ප්‍රයෝජන ලබා ගැනීමේ අදහසින් සිල්වතුන් හා ගුණවතුන් ලෙස මහාජනයා ඉදිරියේ කටයුතු කරන පුද්ගලයන් ද දක්නට ලැබේ. අනුන් රැවටීමේ අදහසින් සිල්වත් වීම ද යට සඳහන් කළ පරිදි වංචනික ධර්මයන්ට අයත් වේ.

එහෙත් මෙම ආශයන්ගේ යථා ස්වභාවය දකින ආර්ය ශ්‍රාවකයා ජීවිතය මැනවින් හැඩගස්වා ගනිමින් නොබියව මරණයට සූදානම් වෙයි. දැහැමින් තම ආර්ථිකය කළමනා කරගන්නා තැනැත්තා ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රශංසා සඳහා හඹා යාමෙන් වැළකී අටලෝ දහමින් ප්‍රකම්පිත නොවේ.

Part 04

# Training the mind for finding innerpeace





Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**

For ease of *bhavana* these 32 parts are grouped into 6 divisions.

**First step of bhavana**

Hair of the head, hair of the body, nails, teeth, skin.
Skin, teeth, nails, hair of the body, hair of the head
Considering the impermanent nature of the body, the mind has to be focused on these both in ascending and descending order. During the process of *Bhavana* one may realize impermanence and the slow, gradual decay and ugliness of the body. This needs to be followed in all 6 steps of the *Bhavana*.

**Second Step**

Flesh, sinuses, bones, marrow, kidneys
Kidneys, marrow, bones sinuses, flesh

**Third Step**

Heart, liver, diaphragm, spleen, lungs
Lungs, spleen, diaphragm, liver, heart

**Fourth Step**

Intestines, mesentery, stomach, excrement, brain
Brain, excrement, stomach, mesentery, intestines

**Fifth Step**

Bile, Phlegm, pus, blood, sweat, lymph
Lymph, Sweat, blood, pus, phlegm, bile

**Sixth Step**

Tears, serum, saliva, nasal mucus ,synovial fluid, urine
Urine, synovial fluid, nasal mucus, saliva, serum, tears

All 6 steps arecarried out in the same manner.
Initially one may concentrate only on one body part. Gradually concentration can be extended to each and every part for all 32 parts. This is a higher level of *bhavana* in which one achieves *Samadhi* through concentration of mind and realization about the relationship between impermanence and the body. If one has difficulties in concentrating on all 32 in sequence, continuous concentration on one by one part along brings significant positive results.
If one's mind is trained to this type of *bhavana*, any type of mind, in particular lustful minds reap the benefits. During early adulthood, when one is leans towards lust, education may be in jeopardy.
It may lead to the problem of finding an appropriate job and other related problems in life. When one cannot be satisfied sexually with one's spouse only, one's mind may be dominated by uncontrolled lust. This dominance does not allow one to recognize who or what one is.
As a result fathers may forget their fatherhood or mothers may forget their motherhood. Many forget brotherhood or sisterhood. Concentrated mind disposed to lust, looks at the opposite sex with uncontrolled desires. When one is unable to satisfy such desires of lust, it begins to burn in one's mind and becomes a perpetual pain
By training the mind into *bhavana* on body parts, early adulthood can be developed into a life that is full of faith, loving kindness, tolerance, equanimity and amity without obsessive desires for sex. Then, life becomes full of harmony and more comfortable. It may lessen the number of divorces and improve family harmony leading to happiness within families and the society at large.

> “By training the mind into *bhavana* on body parts, early adulthood can be developed into a life that is full of faith, loving kindness, tolerance, equanimity and amity without obsessive desires for sex. Then, life becomes full of harmony and more comfortable.”

## දානය වැදගත් ඇයි ?

පින්වත්නි, දනය අප මෙතරම් අගය කරන්නේ ඇයි? මෙතරම් ඉහළින් වර්ණනා කරන්නේ ඇයි? ඔබ දන්නවාද?

- දස පාරමිතා අතර පළමුවැන්න දනය යි
- දස උප පාරමිතා අතර පළමුවැන්න දනය යි
- දස පරමත්ථ පාරමිතා අතර පළමුවැන්න දනයයි
- දස රාජ ධර්ම අතර පළමුවැන්න දනය යි
- සතර සංග්‍රහ වස්තු අතර පළමුවැන්න දනය යි
- ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා අතර පළමුවැන්න දනය යි

මේ ආකාරයට බැලුවම සෑම තැනම පළමු තැනට දනය පැමිණියේ ඇයි? දන්දීම, සිල්රැකීමට වඩා පහසුයි. සිල් රැකීම භාවනා කිරීමට වඩා පහසුයි.

ඒනිසා දන, සීල, භාවනා ලෙසින් පෙළ ගස්වා ඇත. වෙසක් පොහොයට දන්සැල් දෙන්න බොහෝ දෙනා ඉදිරිපත් වෙති. එහෙත් සිල් සමාදන් වෙමුයි, කීවොත් බොහෝ දෙනා පසුබට වෙති. භාවනා කරමුයි කීවොත් තවත් පිරිස අඩු වේ. ඒ අනුව පෙනී යන්නේ ද ශ්‍රද්ධාව ඇති කරගෙන, පළමුව දනයෙන් ආරම්භ කිරීම වඩා යහපත් බව නොවේ ද?

ශාස්ත්‍රපති , රාජකීය පණ්ඩිත
**කොටනෙළුවේ**
**පුඤ්ඤානන්ද හිමි**


# ලාභයෙහි දැඩි ලෝභය
# අනුවණයාගෙ පුරුදු ය

## තණ්ඩුලනාළි ජාතක කතාව



අනුරාධපුර මහා විහාර මහ පිරිවෙනේ
පරිවේණාචාර්ය, කුට්ටම්පොකුණ
විහාරාධිකාරී
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**කිවුලතලාවේ සමිත හිමි**

**එක් සමයක සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන සමයේ ලාළුදායි නම් තෙර නමක් උදෙසා මෙම ජාතක කතාව දේශනා කොට වදළා. එම ලාළුදායි තෙරුන් වහන්සේගේ කතාව මෙසේයි.**



එක කාලයක දබ්බමල්ලපුත්ත ස්ථවිරයන් වහන්සේ අනෙකුත් සංඝයා වහන්සේලාට ලාබත් (පේරු දනය/ සලාක දනය) සඳහා දයකයන්ගේ නම් ඇතුළත් කාඩ්පත් ලබා දුන්නා. උන්වහන්සේ සෑම උදෑසනක ම එම කටයුත්ත බොහෝ ම වුවමනාවෙන්, ගෞරවයෙන් ඉටු කළා. උදායි තෙරුන් වහන්සේට විටෙක යහපත් දන ඇති දයකයන්ගේ නම් ලැබුණු අතර, සමහර විටෙක අයහපත් දන ඇති දයකයන්ගේ නම් ලැබෙයි. එසේ අයහපත් නපුරු දනයක් උදයි ස්ථවිරයන් වහන්සේට ලැබුණු දවසට ලාබත් බෙදන ස්ථානයේ සිට කලබල ඇති කර ගත්තා.

"දබ්බමල්ලපුත්ත තෙරුන් ලාබත් බෙදන්න දන්නව ද?" ඇයි අප නො දනිම් ද? අපටත් පුළුවන් ලාබත් බෙදන්න" කියා රණ්ඩු සරුවල් කළා. දවසක් එසේ ආරවුලට ආ අවස්ථාවක දබ්බමල්ලපුත්ත ස්ථවිරයන් වහන්සේ, "එසේනම් නුඹ වහන්සේ ම මේ සලාක දනවලට අදළ දයකයන්ගේ නම් සඳහන් කාඩ්පත් මහා සංඝ රත්නයට බෙද දුන මැනව" කියා ලාබත් පෙට්ටිය ලාළුදායි තෙරුන් අතට දී ඉවතට ගියා. එතැන් පටන් සංඝයා වහන්සේට ලාළුදායි ස්ථවිරයන් වහන්සේ ලාබත් බෙද දුන්නා. එහෙත් උන්වහන්සේ ලාබත් බෙදීම පිළිබඳ ව කිසිවක් නො දන්නා නිසා විවිධ ගැටලු ඇති වුණා.

පේළියේ වඩින භික්ෂූන් වහන්සේ පිළිබඳ දන්නේ නැහැ. මහා තෙරවරු, කුඩා තෙරවරු කවුද කියා දන්නේ නැහැ. එබැවින් භික්ෂූහු ලාබයෙන් පිරී ගියා. මෙය තවදුරටත් ඉවසාගත නොහැකි වූ බාල භික්ෂු පිරිසකුත්, සාමණේර භික්ෂු පිරිසකුත් පැමිණ "ඇවැත් වූ කලත් ලාළුදායි ස්ථවිරයන් වහන්ස, නුඹ වහන්සේ මෙසේ ලාබත් බෙද දෙතොත් භික්ෂූන් වහන්සේලා බොහෝ ලාභයෙන් පිරිහී යනවා. නුඹ වහන්සේ බත් බෙද දෙන්නට සුදුසු නොවෙයි. මෙතැනින් නික්මුණ මැනව" යි කියා ලාබත් බෙද දෙන තැනින් නෙරපා දැමුවා. ඒ වෙලාවේ ලාබත් බෙද දෙන තැන මහා ශබ්දය අසා ඒ කුමක් දැයි සර්වඥයන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ගෙන් විමසා සිටියා.

**"පින්වත් ආනන්දයෙනි, උදායි තෙරුන් වහන්සේ තමා අඥාන බැවින් අනුන්ට ලාබ හානි කළේ දැන් පමණක් නොවෙයි පෙරත් එසේ කළා"**

**"දබ්බමල්ලපුත්ත තෙරුන් ලාබත් බෙදන්න දන්නව ද?" ඇයි අප නො දනිම් ද?**

"ආනන්දයෙනි, කිමෙක් ද? ලාබත් බෙදන තැන මහත් වූ කෝලාහල ඇසෙන්නේ"

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඒ ලාබත් බෙද දීමේ දී උදායි තෙරුන් වහන්සේ අන්‍ය භික්ෂූන්ගේ ලාබය නැති කළා" යැයි ඇති වූ ගැටලුවක්.

"පින්වත් ආනන්දයෙනි, උදායි තෙරුන් වහන්සේ තමා අඥාන බැවින් අනුන්ට ලාබ හානි කළේ දැන් පමණක් නොවෙයි පෙරත් එසේ කළා"

එහිදී දම්සභා මණ්ඩපයේ රැස්ව සිටි භික්ෂූන් වහන්සේලාගෙන් ආරාධනා ලැබූ තථාගතයන් වහන්සේ එම අතීත කතාව ද දේශනා කොට වදළා.

පෙර කසී රට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කළා. එකල අප මහා බෝසතාණෝ රජ්ජුරුවන්ට වන්නකුකම් කළා. එනම් රජ මාළිගයෙන් බැහැර කරන සහ රජ මාළිගාවට ලබා ගන්න අස්ව, ඇත් ආදීන්ට හා රන්, මුතු, මැණික් ආදීන්ට මිළ ගණන් නියම කරන අයකැමි තනතුර යි. මෙම තනතුර කිසිදු හොරයක්, වංචාවක් නො මැති ව වස්තුවට හිමි මුදලම නියම කොට වස්තුව හිමි ස්වාමියාට අදළ මිලම දුන්නා. රජ්ජුරුවෝ ඉතා ලෝභ වූවෙක් නිසා මෙසේ සිතුවා.

"මේ පුරුෂයා තවදුරටත් වන්නකුකම් කෙරේනම් නොබෝ දිනකින් ම මගේ භාණ්ඩාගාරයේ වස්තු නිමා වෙනවා. ඒ නිසා වෙනත් පුද්ගලයෙකු වන්නකුකම් තනතුරේ තැබීම සුදුසුයි." කියලා. පසුව රජතුමා සිව්මැදුරු කවුළුවෙන් රාජාංගනය දෙස බලන කල එහි ඉතා ලෝභී වූ අඥාන එක් ගම්වැසි පුරුෂයෙකු දැක "මේ තෙමේ මගේ සියලු වස්තුවෙහි අගය තබා අයවැය කරන්නට සමර්ථ වෙයි." සිතා රාජ පුරුෂයෙකු ලවා ඔහු ගෙට ගෙන්වා ගෙන

"දරුව, නුඹ මාගේ භාණ්ඩාගාරයෙහි සේවය කරමින් වස්තුවෙහි අගය තබා අයවැය කොට වනක්කුකම් කරන්නට සමත් වෙයිද"යි ඇසුවා. ඒ පුරුෂයාත්

"යහපත ස්වාමීනි" යි

ගිවිස ගත්තා. රජතුමා ඒ අඥාන පුද්ගලයා වන්නකුකම් තනතුරේ තබා බෝසතාණන් වහන්සේ ඒ තනතුරෙන් නෙරපා හැරියා.

එතැන් පටන් ඒ පුරුෂයා ඇත්, අස්, ආදීන් සහ රන් රුවන් ආදියෙහි මිල නියම කළා. එහෙත් කිසිම වස්තුවක වටිනාකම නො දන්නා නිසා නියම වටිනාකම නො කියා මුවට නැගෙන බාල මිලක් කැමති පරිදි කීවා. ඉතින් ඔහු වන්නකුකම් තනතුර දැරූ නිසා යම් මිලක් කීවේ ද, එයම එම වස්තුවේ මිල ලෙස නියම වුණා. එහෙත් පෙර මෙන් නො තිබූ වටිනාකමෙනුත් බාල මිල ගණන් තමයි ඔහු කීවේ. අනෙක් අතට එය රාජ නියෝගයෙන් දුන් තනතුරක් බැවින් ඔහුගේ වචනයට පිටින් කිසිවෙක් උත්තර බැන්දෙත් නැහැ.

මේ අතර දවසක් උත්තරා පතයෙහි වාසය කරන එක් අශ්ව වෙළෙන්දෙක් අශ්වයන් පන්සියයක් රැගෙන බරණැස් නුවරට පැමිණියා. එම අඥානවන්තයා අසුන් සඳහා සහල් නැළියක් වටී යැයි අගය කී අතර, රාජ අස් ගාලේ අසුන් පන්සිය දෙනා බැන්දා. තම අසුන් පන්සිය දෙනා එකම සහල් නැළියකට මිල වීමෙන් දුකට පත් වූ වෙළෙන්ද පළමු වන්නකුකම් කළ බෝසතාණන් වහන්සේ වෙත එළඹ මේ පුවත කීවා. එතුමා ඔහුට උපායක් කියා දුන්නා. ඒ පුරුෂයාට මෙහෙම කියන්න.

"අපගේ අශ්වයන් එකම සහල් නැළියකට වටින්නේ නම් එම සහල් නැළියේ අගය කොතෙක්දැයි දැන ගැනීමට කැමතියි. ඒ නිසා රජ්ජුරුවන් සමීපයේ සිට එම සහල් නැළියේ මිල කියන්නට ඔබට හැකි නම්, මා ඔබට අල්ලසක් දෙන්නම්" කියා. අල්ලසෙහි ගිජු වූ වන්නක්කයා

"එසේය, මට එය කියන්න පුළුවනි" යැයි පිළිතුරු දුන්නා.

පසුව අස් වෙළෙන්ද එම වන්නක්කයා ද කැටුව රජ්ජුරුවන් සමීපයට ගියා. බෝසතාණන් වහන්සේත්, ඇමති මණ්ඩලයත් ඒ මොහොතේ පැමිණියා. රජ්ජුරුවන් වහන්සේ ඉදිරියේ සහල් නැළියේ අගය කියවීම අරමුණු කරගත් අස් වෙළෙන්ද රජුට පුවත් කියා රජු ලවා සහල් නැළියේ අගය විමසුම් කළා.

'එම්බා වන්නක්කය, පන්සියයක් අසුන් කෙතෙක් මිල ද?'

16 පිටුවට...




# මහා සෑයේ පේසා වළලු නව වාරයක් පොළොවෙහි ගිලෙයි



**මහා සෑයට මුල් ගල් තැබීමට සලකණු කිරීමෙන් පසු නොපසුබට වීර්යය ඇති, බුදු සසුන කෙරෙහි ශ්‍රද්ධා සම්පන්න වූ දුටුගැමුණු මහ රජතුමා එම භූමිය මැද අට දිසාවට යොමු කරන ලද රනින් හා රිදියෙන් නිම කරන ලද පුන් කළස් අට බැගින් තැබ්බවූයේ ය. ඒ රන් හා රිදී කළස් දහසය වටේට නැවුම් කළගෙඩි එක් දහස් අටක් තැබුවේ ය.**

ඉන් අනතුරුව අට දිසාවේ රනින් කළ ගඩොල් තැබුවේ ය. ඒ රන් ගඩොල් පිරිවරා සිටිනා ලෙසින් රිදී ගඩොල් එකසිය අට බැගින් තබන ලද්දේ ජීවමාන මව්පියන් ඇති ජාති සම්පන්න වූ ඇමැති පුත්‍රයෙක් අතිනි. රන් ගඩොලින් එකක් මිත්තසේන මහ රහතන් වහන්සේ නැගෙනහිර දිසාවේ සෑය වට රේඛාව සලකණු කළ ස්ථානයේ සුවඳ කැවූ මැටි පිඩක් මත තබන ලද්දේ ය.

ජයසේන මහ රහතන් වහන්සේ විසින් ඒ මත පැන් ඉස එය සැන්දකින් සමකොට සකසනු ලැබූහ.

මේ ආකාරයෙන් උතුම් මංගල ආකාරයෙන් සකස් වූ තැන ප්‍රථම මංගල ගඩොල පිහිටුවා වදාළහ. මහා සුමන මහ රහතන් වහන්සේ එතැනට දෑ සමන් මල් පූජා කළ සේක. ඒ උතුම් අවස්ථාවේ දී සැදැහැයෙන් මහත් සතුටට පත් ලක් පොළොව මුහුදු කෙළවර දක්වා කම්පිත විය.

ඉන් අනතුරුව ඉතිරි රන් ගඩොල් සතත් අනෙක් දිසාවන් කලින් ආකාරයට ම මංගල ආකාරයෙන් සැකසූ ස්ථානයන්හි අමාත්‍ය මණ්ඩලයේ එක් එක් අමාත්‍යයන්ලවා පිහිටවූයේ ය.

මේ ලෙසින් වෙසක් පුන් පොහෝදින ආරම්භ කරන ලද ස්වර්ණමාලී මහා ස්තූපයේ මුල් අවස්ථාවේ වැඩ කටයුතු ඇසළ මස පුන් පොහෝදින සම්පූර්ණ කරන ලදී.

රජතුමා සතරදිසාවෙන් ම වැඩසිටියා වූ නිකෙලෙස් මහ රහතන් වහන්සේලාට වන්දනාකර පූජාවන් පවත්වා ඉතා සතුටු සිතින් යුතුව පිළිවෙලින් ඊසාන දෙසට ගොස් පියදස්සී මහ රහතන් වහන්සේට වන්දනා කර එකත් පසෙක සිට ගත්තේ ය. පියදස්සී මහ රහතන් වහන්සේ මෙම මංගල අවස්ථාවේ සතුට වඩා වර්ධනය කරවමින් දුටු ගැමුණු රජතුමා ඇතුලු සැදැහැවත් ජනයාගේ සිත් නිවන් මගට යොමු කරවමින් චතුරාර්ය සත්‍ය ධර්මය දේශනාකොට වදාළහ.

ඒ උතුම් වූ චතුරාර්ය සත්‍ය ධර්ම දේශනය අසා මහා සෑය පිහිටුවන භූමියේ සිටි හතළිස් දහසක් ජනයා ශ්‍රද්ධාවෙන් ධර්මාවබෝධය ලැබූහ. සතළිස් දහසක් දෙනා සෝවාන් ඵලයට පත්වූහ. දහසක් දෙනා සකෘදාගාමී වූහ. දහසක් ජනයා අනාගාමී වූහ. දහසක් ගිහි ජනයා අරහත්වයට පත් වූහ. දහ අට දහසක් පමණ භික්ෂූන් වහන්සේලා ද, දහ හතර දහසක් භික්ෂුණීන් වහන්සේලා ද රහත් ඵලයෙහි පිහිට වූ සේක.

ගෞතම බුදු සසුනෙහි පහන් වූ සිත් ඇති දුටුගැමුණු මහරජතුමා ගේ ආයාචනය පරිදි වැඩමකොට වදාළ මහ සංඝ රත්නයට මහ රජතුමා මේ ආකාරයෙන් ආරාධනාවක් ද කළ සේක. "යම් දවසක මහා සෑයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ වෙයි ද, එතෙක් කල් ම මාගේ දන් පැන් පිළිගන්නා සේක්වා" යනුවෙනි.

එපමණ කාලයක් දානයට ඇරයුම් කිරීම භික්ෂු වහන්සේලා පිළිගත්තේ නැත. ඒ හේතුවෙන් මහ රජතුමා ක්‍රමයෙන් කාලය අඩුකරමින්, අවසානයේ සත්දිනක්වත් දානය පිළිගන්නා සේක්වා යැයි ආරාධනා කරනු ලැබීය. සත් දවසක ආරාධනය මහා සංඝයා වහන්සේලා පිළිගෙන වදාළහ. මහත් වූ සතුටට පත් වූ දුටුගැමුණු රජතුමා විසින් ස්තූප භූමියේ අවට දහඅට ස්ථානයක මණ්ඩප තනවනු ලැබුවේ ය. එම මණ්ඩපයන්ට සංඝයා වහන්සේලා වඩමවා සත් දවස ම සඟ සතු මහා දානයන් දුන්නේ ය.



> **ඒ නැණවත් උළු බාස් රන්තලියක් ජලයෙන් පුරවාගෙන රජතුමා ඉදිරියට පැමිණියේ ය. අතින් දිය ස්වල්පයක් ගෙන ඒ දිය පිටට ගැසූ කල් හි රන්තලියේ පිර වූ ජලය මතින් සුවිසල් පලිඟු ගෝලයක් බඳු මහා දියබුබුළක් පැන නැංගේය. "පින්වත් මහ රජතුමනි, මෙබඳු සුන්දර සෝභා ඇති ස්තූප ගර්භයක් ගොඩනගන්නෙමි යි" පැවසුවේ ය.**

ඉන් අනතුරුව දුටු ගැමුණු මහ රජතුමා අඬ බෙර ගස්සවා ඉක්මනින් ම උළු වඩුවන් රැස් කර වූයේ ය. උළු ගඩොල් සෑදීමට දන්නා අය පන්සියයක් පමණ පැමිණියේ ය. "තොප මහා සෑය ඉදි කිරීමට ගඩොල් සාදන්නේ කෙසේ ද?" යැයි රජතුමා ඇසුවේ ය. "මා කම්කරුවන් සියයක් ලබාගෙන, මැටි ගැලකුත් ලබාගෙන ය. ඒ ගැලේ මැටි එක් දිනක දී අවසන්වන තුරු ගඩොල් සාදන්නම්" කියා ය. රජතුමා ඔහු වළක්වන ලදී.

අනෙක් පුද්ගලයා ගැල් භාගයක මැටි වැඩ එක්දිනකින් කරන්නම් කිවේ ය. තවත් වඩුවෙක් ගැල් කාලක මැටි වැඩ දවසින් කරන්නම් කීවේ ය. තවත් වඩුවෙක් අමුණු දෙකක මැටි දිනක් තුළ වැඩ කරන්නම් කීවේ ය. මහ රජතුමා එම උළු බාස්වරු සතර දෙනා ම වැළැක්වී ය.

එම අවස්ථාවේ දී එතැන සිටි නුවණැති ව්‍යක්ත සිරිවඩ්ඪක නමැති උළු බාස් මහ රජතුමාට මෙසේ කීවේ ය. "වංගෙඩියේ කොටා කුල්ලෙන් පොළා, මිරිස් ගලේ අඹරවා ගත් එක් අමුණක මැටියෙන් දිනක් වැඩ කරන්නම්". මෙසේ කී විට ස්තූප කර්මාන්තයේ දී සක් දෙවිඳු හා සමාන මහත් වූ වීර්යයකින් යුක්ත වූ මහ රජතුමා ඔහුගේ අදහස පිළිගන්නා ලදී. එසේ නම් තොප කොයි ආකාර හැඩයකින් ද මහා සෑය ගොඩනගන්නට සිතා සිටින්නේ දැයි විමසන්නේ ය. ඒ අසන සැණින් විශ්වකර්ම දෙව්පුතු ඔහුට ආවේශ වූයේ ය.

විශ්වකර්මදිව්‍ය පුත්‍රයාගේ බැල්මෙන් යුක්තව ඒ නැණවත් උළු බාස් රන්තලියක් ජලයෙන් පුරවාගෙන රජතුමා ඉදිරියට පැමිණියේ ය. අතින් දිය ස්වල්පයක් ගෙන ඒ දිය පිටට ගැසූ කල් හි රන්තලියේ පිර වූ ජලය මතින් සුවිසල් පලිඟු ගෝලයක් බඳු මහා දියබුබුළක් පැන නැංගේය. "පින්වත් මහ රජතුමනි, මෙබඳු සුන්දර සෝභා ඇති ස්තූප ගර්භයක් ගොඩනගන්නෙමි යි" එම වඩුතුමා පැවසුවේ ය. එකල්හි දුටුගැමුණු මහ රජතුමා අතිශයින් ම සතුටට පත් වූයේ ය. කහවණු දහසක් වටිනා වස්ත්‍ර යුගලක්, රන් කැටයම් ඇමූ කහවණු දහසක් වටිනා මිරිවැඩි සඟලක්, කහවණු දොළොස් දහසක් ඔහුට ලැබෙන්නට සැලැස්විය.

සැදැහැ සිතින් ඔද වැඩී ගිය සිත් ඇති දුටුගැමුණු මහ රජතුමා, මා මිනිසුන් නො පෙළවා සෑය ගොඩනගන තැනට ගඩොල් ගෙනෙන්නේ කෙසේ දැයි සිත සිතා සිටින කල් හි ඒ ඒ දිනට වුවමනා ගඩොල් දේවානුභාවයෙන් මහා සෑයේ දෙරටු සතර අසල ගොඩගසන්නේ ය. මේ දේවානුභාවය දුටු, දුටු ගැමුණු මහ රජතුමා අතිශයින් ම සතුටට පත් වූයේ ය.

මෙහි කිසියම් වූ කටුත්තක් නොමිලේ නොකළ යුතු යැයි දැනුම් දෙන ලද්දේ ය. ඒ ඒ දෙරටුවෙහි සොළොස් ලක්ෂය බැගින් රන් කහවනු ද, බොහෝ වස්ත්‍රාභරණයන් ද ප්‍රණීත වූ ආහාරයන් ද, සුවඳ විළවුන් වර්ගයන් ද, මුව සුවඳ කරවන්නා වූ බෙහෙත් වර්ගයන් ද, තබ්බවා චෛත්‍ය කර්මාන්තය කරවන්නා වූ සියල්ලන්ට ම අවශ්‍ය පරිද්දෙන් ගන්නට සැලැස් වූයේ ය.

ස්වර්ණමාලි මහා සෑය කරවන කල්හි ඒ සඳහා වෙහෙස මහන්සි වූ සිය දහස් සංඛ්‍යාත අනේක ජනයා පහන් සිතිවිලි උපදවා ගනිමින් බොහෝ පින් රැස් කර ගත්තා හ. බුදු රජාණන් වහන්සේ කෙරෙහි ඇති කරගත් පිවිතුරු ශ්‍රද්ධාව හේතුවෙන් සුගතියේ උපදින්නේ යැයි දන්නා වූ සැදැහැවත් ජනයා සතුටු සිතින් ම පින්කම් කළහ.

දීපා පෙරේරා

බුදු සරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
බිනර පුර අටවක 2020.08.25

## දෙලොව සුව පිණිස

සැබෑ බෞද්ධයා නම් දිවි හිමියෙන් ම තෙරුවන් සරණ ගිය පුද්ගලයා ය. කවර හේතුවක් නිසාවත් ඔහු හෝ ඇය සද්ධර්මයට පිටුපාන්නේ නැත. පවින්, අකුසලයෙන් බැහැර වූ හෙතෙම තමන්ට ද, අන්‍යයන්ට ද හිත පිණිස ම වන්නේ ය.

එහෙත් අප අද අඩු වැඩි වශයෙන් පොදු මිනිස් සමාජයේ දී විඳින අත්දැකීම් බොහෝවිට කටුක ය. පීඩාකාරී ය. වේදනාකාරී ය. මිනිසුන් විසින් මිනිසුන් වෙත මුදා හරින විවිධාකාර බලපෑම් ඊට එක් පැත්තකින් හේතු වේ.

අනෙක් පැත්තෙන් සොබා දහමෙන් ලැබෙන දඬුවම් ය. විටෙක ගං වතුර ය. නාය යෑම් ය. සුළි සුළං ය. තවත් විටෙක දැඩි නියඟය වගා හානි කරන්නේ ය. විවිධ හේතු නිසා දහඩිය මහන්සියෙන් වගා කළ හේන් කුඹුරු පාළු වී යන්නේ ය.

තවත් පැත්තකින් ලෙඩ රෝග ය. අන් කවරදා හෝ අසා නැති විවිධ ලෙඩ රෝග දැන් බහුල ය. මිනිසුන් ගේ ආයුෂ අඩු ය.

බුදු දහමට අනුව නම් මෙවැනි දුක් කරදර, විපත් සියල්ලට හේතු වන්නේ මිනිසා ම ය. මිනිසාගේ ක්‍රියාකාරකම් ය.

අංගුත්තර නිකායේ දුතිය පණ්ණාසකයේ බ්‍රාහ්මණ වර්ගයේ මේ පිළිබඳ ව අපූර්ව කතා පුවතක් වේ. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි බමුණෙක් උන්වහන්සේගෙන් විමසූයේ අතීතයේ මේ ලෝකය අවීචිය මෙන් මිනිසුන්ගෙන් පිරී පැවති බවත්, කුකුළකුට වහලින් වහලට යා හැකි වන සේ ළංව පිහිටි නිවෙස් තිබූ බවත් පිළිබඳව පෙර සිටි වැඩහිටි ආචාර්යවරුන්ගෙන් තමන් අසා ඇති බවය.

එහෙත් මෙකල මිනිසුන්ගේ යම් අඩු බවක්, තුනී බවක් පෙනෙන බව ය. ඊට හේතු කවරේ ද යන්න ය. එහිදී බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ ලෙස, මිනිස්සු අන්සතු වස්තුව පිළිබඳව රාගයෙන් ඇලී, මඩනා ලද ලෝභයෙන් යුතු වෙති. වැරැදි සේවනයන් හි යෙදෙති. ඒ නිසාම තියුණු ආයුධ රැගෙන ඔවුනොවුන්ගේ දිවි තොර කර ගනිති. ඒ හේතුවෙන් බොහෝ දෙනා මිය යති. මිනිසුන්ගේ අඩුවක් වීමට එය ද හේතුවක් වන බව ය.

බුදුරජාණන් වහන්සේ එම බමුණාට විස්තර කළ ලෙස එවැනි මිනිසුන්ට නිසි කලට වැසි ලැබෙන්නේ නැත. ඒ හේතුවෙන් ශස්‍ය මනා ලෙස පැසෙන්නේ නැත. සේතට්ඨිකා නම් ශස්‍ය රෝගය වැළඳෙන්නේ ය. පැළවල දඬු පමණක් වී අස්වනු හට නොගන්නේ ය. මේ නිසා වන ආහාර හිඟයෙන් ද බොහෝ මිනිස්සු මිය යති. මිනිසුන්ගේ අඩුවීමට එය ද හේතුවක් වේ.

එමෙන් ම අන්සතු වස්තුව පිළිබඳ ව රාගයෙන් ඇලුණු, ලෝභයෙන් මැඩුණු වැරැදි සේවනයන් හි යෙදෙන මිනිසුන් අතරට යක්ෂාධිපතිහු , සැඩ පරුෂ යකුන් මුදා හරිති. මේ නිසා ද බොහෝ මිනිස්සු මිය යති. මිනිසුන්ගේ අඩුවීමට මෙය ද එක් හේතුවක් වේ.

තථාගතයන් වහන්සේ මෙම බමුණාට දුන් පිළිතුර අපට හිතන්නට බොහේ දේ ඉතිරි කර තිබේ. විපතෙහි වැටෙන්නේ අප විසින් ම සිදුකරන ක්‍රියාකාරකම්හි ප්‍රතිඵල නිසා ය.

ශ්‍රී සද්ධර්මය තුළ අප යා යුතු නිවැරැදි මාවත පෙන්වයි. ඒ ගමන් මග මෙලොවට සේ ම පරලොවට ද වැඩ දායක ය. ලෝභ, ද්වේශ, මෝහාදී අකුසල සිතිවිලිවලින් මඩනා ලද සිත පිරිසුදු කර ගනිමු. අපි නිවැරැදි බෞද්ධයන් ලෙස, බොදු මග යමින් දෙලොව ජීවිතය සුවපත් කර ගනිමු.

# නිවන වළකන බාධක

**ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වැනි අයහපත් මානසික ක්‍රියාකාරීත්වයන්, සිතිවිලි නිරන්තරයෙන් අපගේ සිතෙහි ඇති වේ. එම සිතිවිලිවලට අනුව අප ක්‍රියාත්මක වේ. නමුත් එහි බරපතළකම, විපාකයන්ගේ වේදනාකාරීත්වය පිළිබඳ අප එතරම් සිතන්නේ නැත.**

> **ක්‍රෝධයෙන්, වෛරයෙන් මිදෙන්නට අපාය භය සිහිකළ යුතු ය. ක්‍රෝධය මුල් කරගෙන මම මේ වන විට නිරයේ කොයි තරම් නම් දුක් විඳලා ඇති දැයි සිතිය යුතු ය. අනාගතයේ ක්‍රෝධ කිරීම නිසා කොයි තරම් දුක් විඳින්න සිද්ධ වේ දැයි කල්පනා කළ යුතු ය. එවිට ක්‍රෝධයෙන් මිදිය හැකි ය.**

මිනිසුන්ට පමණක් නො ව, අපා – දෙපා – සිව්පා හා බහුපා ආදී පෙනෙන – නො පෙනෙන සියලු සත්වයන් කෙරෙහි බොහෝ අවස්ථාවල වෛරයෙන් හා ක්‍රෝධයෙන් අපි කටයුතු කරමු. එහි දී ආදීනවයන් පිළිබඳ කිසි ලෙසකින්වත් තැකීමක් කරන්නේ නැත. ක්‍රෝධ කිරීම තුළින් පුද්ගලයාට සිදු වන අනර්ථය අප මනා සිහියකින් අවබෝධ කර ගෙන සිත මෛත්‍රියෙන් පුරවා ගත යුතු ය.

වරෙක කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේ කරා පැමිණ මෙසේ විමසා සිටියි. “තථාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්ස, මේ ලෝකයේ සත්ත්වයාගේ විපත පිණිස, අහිත පිණිස, දුක් පිණිස හේතුවන කරුණු කීයක් තිබේ ද කියලා. ඒ වේලාවෙහි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සත්වයාගේ අහිත පිණිස, දුක් පිණිස, විපත පිණිස හේතුවන කරුණු තුනක් පවතින බව, එනම්

පුද්ගලයා තුළ හටගන්නා ලෝභය
පුද්ගලයා තුළ හටගන්නා ද්වේෂය
පුද්ගලයා තුළ හටගන්නා මෝහය

මේ කරුණු අනුව යම් පුද්ගලයෙක් ලෝභ, ද්වේෂ හා මෝහයෙන් මඩනා ලද සිත් ඇති ව කටයුතු කරයි නම්, ඒ හේතුවෙන් එම පුද්ගලයා දුකට පත් වන බවත්, එසේ කටයුතු නො කිරීම හේතුවෙන් එය යහපත පිණිස, හිතසුව පිණිස, සැප පිණිස හේතුවන බවත් බුදුරජාණන් වහන්සේ වැඩි දුරටත් දේශනා කළහ.

එසේ නම්, පුද්ගලයාගේ ජීවිතයේ සමෘද්ධිමත් බව පිණිස, යහපත් අර්ථ සහිත බව පිණිස කිසිවෙකුටත් වෛර නො කළ යුතු ය. ඊර්ෂ්‍යා නො කළ යුතු ය. නින්දා නො කළ යුතු ය. ක්‍රෝධ නො කළ යුතු ය. මෛත්‍රිය වැඩිය යුතු ය. බුදුරජාණන් වහන්සේ අපට පෙන් වූ මාවත එය යි. ක්‍රෝධයෙන් මිදීමේ පිළිවෙත එය යි.



රාස්සගල චන්දකිත්ති හිමි

එසේ ම ක්‍රෝධය යනු නිවන වළකන බාධකයකි. නිවනින් අප ඈත් කර තබන්නේ මෙම ක්‍රෝධය යි. බුදුරජාණන් වහන්සේ මෙය තේරුම් ගැනීමට ලස්සන උපමාවක් දේශනා කර තිබෙනවා. එනම් ක්‍රෝධය විෂ මුල් ඇති මිහිරි අග ඇති ගසක් වැනි ය. විෂ මුල් කියන තරහින් තමා එය පෝෂණය වන්නේ. පළිගැනීමෙන් තමා සතුටු වෙන්නේ. කුමන දෙයක් කර හෝ පළිගැනීම එක ම අරමුණ වේ. එය අපගේ අනර්ථය පිණිස, දුක් පිණිස හේතු වන අකුසලකාරකය කි.

එම නිසා ක්‍රෝධයෙන්, වෛරයෙන් මිදෙන්නට අපාය භය සිහිකළ යුතු ය. ක්‍රෝධය මුල් කරගෙන මම මේ වන විට නිරයේ කොයි තරම් නම් දුක් විඳලා ඇති දැයි සිතිය යුතු ය. අනාගතයේ ක්‍රෝධ කිරීම නිසා කොයි තරම් දුක් විඳින්න සිද්ධ වේ දැයි කල්පනා කළ යුතු ය. එවිට ක්‍රෝධයෙන් මිදිය හැකි ය.

බුදුරජාණන් වහන්සේගේ කාලයේ සිටියා එක්තරා කරණවැමියෙක්. ඔහු වයසට ගොස් තම දරුවන් දෙදෙනා ද සමඟ පැවිදි වුණා. දවසක් මෙම භික්ෂුවට අවශ්‍ය වුණා බුදුරජාණන් වහන්සේට දනයක් පූජා කරන්න. ඒක නිසා තම දරුවන් දෙදෙනා ද කරණවැම් කටයුතු දන්න නිසා දරුවන් දෙදෙනා ගම්වලට පිටත් කර හරිනවා කොණ්ඩෙ කපලා මුදල් සොයා ගෙන එන්න කියලා. මිනිසුන් ද මුදල් දීලා පොඩි හාමුදුරුවරු දෙදෙනාගෙන් කොණ්ඩෙ කපා ගත්තා. මුදල් සොයා ගෙන ආවට පස්සේ එම මුදල්වලින් දනය පිළියෙළ කරලා බුදුරජාණන් වහන්සේට පූජා කරන්න සූදානම් වුණා. දනයට වැඩම කරලා බුදුරජාණන් වහන්සේ එම භික්ෂුවගෙන් ඇසුවා කොහොමද මේ දනය පිළියෙළ කළේ කියලා. ඒ වෙලාවේ අර භික්ෂුව සියලු විස්තර බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කළා. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ඒ පිළිබඳව අප්‍රසාදය දක්වා දන් නො වළ ද ම නිවසින් පිට ව ගියා. ඒ පිළිබඳව අර මහලු භික්ෂුව වෛරයක්, ක්‍රෝධයක් ඇති කර ගත්තා. එම භික්ෂුව තමයි බුදුරජාණන් වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩ සිටිය දී අභද්‍ර වචනය ප්‍රකාශ කළ සුභද්‍ර භික්ෂුව.

ක්‍රෝධයේ ලක්ෂණය මෙය යි. තමාගේ ශාස්තෘවරයන් වහන්සේගේ පිරිනිවීම පවා සතුට දනවන කරුණක් බවට පත් කරගත්තේ මෙම ක්‍රෝධයේ ඇති පහත්, නිවට නියාලු ගතිය මොනවට පැහැදිලි කරමිනි. මෙවැන්නෙකුට සසර ගමනින් මිදීම අතිශය අපහසු ය. සසර ගමන් තව තවත් දීර්ඝ වීමක් ම පමණක් ම වේ.

# අමරපුර මහා නිකායේ සංඝ සභාවේ ස්ථිර ගොඩනැඟිල්ල විවෘත කිරීම අගමැති සුරතින්





අමරපුර මහා නිකායේ සංඝ සභා කාර්යාල ස්ථිර ගොඩනැඟිල්ල ගාලු පාර, කොළඹ 06 ස්ථානයේ දී පසුගියද මහින්ද රාජපක්ෂ අගමැතිතුමා අතින් විවෘත කෙරිණි. එම අවස්ථාවට ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක කොටුගොඩ ධම්මාවාස මහානාහිමි, අමරපුර මහා සංඝ සභාවේ ප්‍රධාන සභාපති ශාස්ත්‍රපති ගන්තුනේ අස්සජි හිමි, ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ මහෝපාධ්‍යාය දෙඩම්පහළ චන්ද්‍රසිරි මහ නා හිමි, අමරපුර සංඝ සභාවේ මහා ලේඛකාධිකාරී මහාචාර්ය පල්ලේකන්දේ රතනසාර අනු නා හිමි, ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උප සභාපති අහුංගල්ලේ සිරි ශීල විසුද්ධි නා හිමි , සියම් මහා නිකායේ කෝට්ටේ පාර්ශ්වයේ මහා ලේඛකාධිකාරී මහාචාර්ය කොටපිටියේ රාහුල අනුනායක හිමි, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා ලේඛකාධිකාරී අත්තන්ගනේ ශාසන රතන හිමි ඇතුළු මහා සංඝරත්නය ප්‍රමුඛ ගිහි පිරිසක් ද සහභාගි වූහ.









## පිරිවෙනටත් බුදුසරණ

අප රටේ පුරාතන සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය වූ පිරිවෙන මුල්කරගෙන එහි සුවිශේෂී අනන්‍යතාව මේ යැයි විදහා දක්වමින් දිගහැරෙන "පිරිවෙන" පිටුව සතිපතා බුදුසරණ පුවත්පත තුළින් ඉදිරිපත් කෙරෙයි. ඒ අනුව ලංකාවේ 829 ක් වූ පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පුවත් හා පිරිවෙන් අධ්‍යාපනය හා අදාළ සුවිශේෂී ලිපි සඳහා මෙම පිටුව වෙන් කෙරෙන අතර සියලු ලිපි, තොරතුරු හා ඡායාරූප සඳහා මෙම පිටුව වෙන් කෙරේ.

පිරිවෙන්වලට අදාළ පුවත්, ඡායාරූප සහ ලිපි අප වෙත යොමු කරන්න.
budusarana@lakehouse.lk
බුදුසරණ කර්තෘ මණ්ඩලය , ලේක්හවුස්, කොළඹ

## සමාජයේ යහපත පිණිස වන භික්ෂූන් වහන්සේ

ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසා පතා අනුන් සිත් ඇදෙන සේ චාටු බස් තෙපළන්නෝ වෙත් ද, ඔවුහු මහණ දම් පුරන්නෝ නොවෙති.

සසුන් පිළිවෙත රැකීමට නම්, අධි චිත්ත සුවය විඳීමට නම් චක්ඛු , සෝත, ඝාන, ජිව්හා , කාය මන යන ඉන්ද්‍රියන් රැකිය යුතු ය.

සතුරන්ට පැමිණිය නොහැකි සේ ප්‍රධාන දොරටු රැකවරණ යොදු වහන්නේ යම් සේ ද, එමෙන් ම සිල්වත් මහණ තෙමේ, මහණ දම් පිරීමට ඇප කැප වූ හෙයින් ඉන්ද්‍රියන් වැසූ දොරටු ඇත්තකු විය යුතු ය.



ජාතික පිරිවෙන් උපදේශක
ශාස්ත්‍රපති
**දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි**

සිහි නුවණින් යුතු ව ක්‍රියා කරන මහණහු විෂම සමාජයේ යහපත පිණිස ම හේතු වන්නා හ.

## ඵලදායී පිරිවෙනක් උදෙසා

**පිරිවෙනක ඵලදායීතාව යනුවෙන් අදහස් කරන්නේ පිරිවෙන විසින් ස්ථාපිත කරන ලද අරමුණු සාක්ෂාත්කරණය යි. පිරිවෙන තුළින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගනියි නම් එම පිරිවෙන ඵලදායී පිරිවෙනක් ලෙස හැඳින්විය හැකි ය. පිරිවෙන තුළ අරමුණු ඉටු කර ගැනීමේ දී එහි පවතින භෞතික සම්පත් මෙන්ම මානව සම්පත් ද කාර්යක්ෂම ව මෙන්ම උපරිම ප්‍රයෝජනයට ගැනීම අතිශයින් වැදගත් වේ.**

පිරිවෙන තුළ ඇති සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ඒවා කාර්යක්ෂම ව භාවිත කිරීමෙන් පිරිවෙනේ අරමුණු ඉටුකර ගැනීමට හැකි නම් එය ඵලදායී පිරිවෙනක් ලෙස නම් කළ හැකි ය. පිරිවෙනක් ඵලදායී ලෙස ගොඩ නැගීමට උත්සුක වීමේ දී මූලික වශයෙන් පැහැදිලි අරමුණක් තිබීම ඉතා වැදගත් වේ. අරමුණක් නොමැති සෑම ක්‍රියාවලියක්ම අසාර්ථක වීමට ඉඩ ඇත.


බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලබා ගැනීමට ඒකායන අරමුණකින් ක්‍රියා කළ ආකාරය ත්‍රිපිටක අධ්‍යයනය තුළින් මනාව පැහැදිලි වේ.

එමෙන් ම අරමුණකින් තොරව ලැබෙනුයේ අසාර්ථක ප්‍රතිඵලයකි. පිරිවෙන ඵලදායී ලෙස ගොඩ නැගීමට අරමුණක් පමණක් ප්‍රමාණවත් නොවේ. එයට ඉලක්කගත වැඩපිළිවෙළක් තිබීම අත්‍යවශ්‍ය කරුණකි.

පිරිවෙන වූ කලි බුදු දහම මූලික හරය කර ගනිමින් වර්තමාන විෂය දැනුම සමඟ අධ්‍යාපනය ලබා දෙමින් විනයගරුක ජන පරපුරක් බිහි කිරීමට උනන්දු වන ආයතන පද්ධතියකි. එනිසා ඉතා අනර්ඝ විෂය මාලාවක් මෙන් ම එතුළින් ශිෂ්‍ය කුසලතා සහ ආකල්ප සංවර්ධනය වීමද ඉතා වැදගත් වේ.

එමෙන්ම ගුරු මණ්ඩලය තුළ ඉහළ අපේක්ෂාවන් තිබිය යුතු අතර ඉහළ කැප කිරීමක්ද තිබිය යුතු ය. එමෙන් ම සුවිශේෂ ආරක්ෂිත පරිසරයක් තිබීම ද සිසුන් තෘප්තිමත් භාවයෙන් පිරිවෙන කරා පැමිණීම ද ඵලදායී පිරිවෙනක් ගොඩ නැගීමට ඉවහල් වේ.

බදුල්ල දිස්ත්‍රික් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
(පිරිවෙන් සම්බන්ධීකරණ) රාජකීය පණ්ඩිත
**තිත්තගල්ලේ ඤාණරතන හිමි**



ජේරුකානේ චන්දවිමල නා හිමි

# ප්‍රාර්ථනාව

**මරණින් මතු සුගතියෙහි උපදවා සම්පත් ලබා දීමේ ශක්තියක් පින්වල ඇත. එබැවින් පින් කළ තැනැත්තා කොහි හෝ සුගතියක උපදින්නේ ය.**

සුගතිය වුව ද සැම තැනම යහපත් නැත. මිසදිටුවන් වෙසෙන පව් කම්හි ඇලී ගැලී වෙසෙන, පව්කමින් ජීවත් වන මිනිසුන් අතර තමා කළ කුසල බලයෙන් උපනහොත් ඒ තැනැත්තාට සිදු වන්නේ තමා ඇසුරු කරන ඒ මිනිසුන් අනුව පව්කම් කොට අපාගත වීමට ය. දෙව්ලොව වුව ද සම්පත්තියෙන් මත් ව ධර්ම සංඥාවක් නැතිව කල් යවන දෙවියන් වෙසෙන තැනක උපන හොත් තමා කළ පින් අවසන් වීමෙන් පසු අපාගත විය හැකි ය. එබැවින් පින් කරන්නවුන් විසින් පවින් තොරව වෙසෙමින් ඉදිරියටත් පින්කම් කර ගැනීමට අවකාශ ලැබෙන තැනක ඉපදීමට පැතිය යුතු ය. **කුසලං කම්මං කත්වා එකස්මිං ඨානෙ පත්ථනං කාතුං වට්ටති** යනුවෙන් කුසල් කොට යම්කිසි සුදුසු ස්ථානයක ඉපදීම පැතිය යුතු බව සංඛාරුප්පත්ති සූත්‍ර අටුවාවෙහි ද කියා ඇත්තේ ය. මුදල් ඇතියකුට මුදලින් තමා කැමති දෙයක් ගත හැකිවක් මෙන් පින් ඇති තැනැත්තාට ප්‍රාර්ථනා කළාම ඒ පිනෙන් තමා කැමැති තැනකට යා හැකි ය. යා යුත්තේ සොයා ගත යුත්තේ පවින් වැළකී පින් දියුණු කර ගත හැකි තැන් ය.

**ජේරුකානේ චන්දවිමල නා හිමියන්ගේ 'පුණ්‍යොපදේශය' ඇසුරෙනි**

# විද්‍යාලංකාර ත්‍රිපිටක ධර්ම සංගායනාව

## සැත්තෑ වසරකට පෙර ආරම්භ වූ හැටි



ත්‍රිපිටක ධර්ම සංගායනාව පැවැත් වූ පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන

**ලක්දිව ශාසන ඉතිහාසයෙහි අප්‍රකට ව පවතින සුවිශේෂී සංසිද්ධියක් වූ, බුරුම රට ඡට්ඨ සංගායනාව සඳහා පූර්වාදර්ශ සපයන ලද පෑලියගොඩ විද්‍යාලංකාර පිරුවෙනෙහි පැවති ත්‍රිපිටක ධර්ම සංගායනාව ආරම්භ කොට මෙම අගෝස්තු මාසයට සැත්තෑ වසරක් සපිරෙයි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

වර්ෂ 1875 නොවැම්බර් පළමුවන දින රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මාහිමියන් ආරම්භ කරන ලදුව ඉන් පසු පිළිවෙළින් රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමියන් සහ ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නාහිමියන් පරිවේණාධිපති ධුරය හොබවන ලද පෑලියගොඩ විද්‍යාලංකාර පිරුවෙනෙහි සැත්තෑ පස්වන වජ්‍ර ජයන්තිය 1950 වර්ෂයේ දී එළඹුණි. ශ්‍රී ලංකාවේ අග්‍රගණ්‍ය ප්‍රාචීන බෞද්ධ අධ්‍යාපන ආයතනයක් ලෙසින් සම්භාවනාවට පත් විද්‍යාලංකාර පිරුවන බඳු ආයතනයක වජ්‍ර ජයන්ති ජන්මෝත්සවය පෙරහර සහ ප්‍රීති කතා පවත්වන උත්සවයක් නොවිය යුතු බවත්, ලොවටම ආදර්ශයක් සපයන දෙස, බස, දැය, සමය උද්දීපනය කරන අන්දමේ සැමරුමක් විය යුතු බවත්, ඒ අනුව ත්‍රෛනිකායික භික්ෂූන් වහන්සේලා වැඩමවා ත්‍රිපිටක ධර්ම සංගීතියක් පැවැත්වීම සුදුසු බවට මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් පරිවේණාධ්‍යක්ෂ යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමියන් වෙත සිදු කරන ලද යෝජනාව පරිවේණාධිපති කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමියන් ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය අනුමත කරන ලදින් විද්‍යාලංකාර ත්‍රිපිටක ධර්ම සංගායනාව පවත්වන ලදි.




ත්‍රිපිටක ධර්ම සංගීති මණ්ඩපය



බුරුමයේ ශාසන කටයුතු අමාත්‍යතුමාගේ පැමිණීම



ත්‍රිපිටක ධර්ම සංගායනාව සඳහා වැඩම කළ මහා සංඝ රත්නය



ත්‍රිපිටක ධර්ම සංගීති අවස්ථාවෙහි විද්‍යාලංකාර පරිවේණාධිපති කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි


ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවලට රැගෙන ගිය පුස්කොළ පොත් එම රටවල භාෂාවන්ට පරිවර්තනය වී තිබුණ ද, මේ අවධිය වන විට අංග සම්පූර්ණ අන්දමින් ත්‍රිපිටකය සිංහලයට පරිවර්තනය වීමක් තබා සිංහල අකුරින් පාලි ත්‍රිපිටකය මුද්‍රණය වී නොතිබුණි. මෙරට පැරණි පුස්කොළ පොත් අනුගමනය කළ භාෂා සම්ප්‍රදායන්ට අනුකූල ව ත්‍රිපිටකය සංස්කරණය කොට සිංහල අකුරින් පාලි ත්‍රිපිටකය මුද්‍රණය කිරීම සහ ඉන් පසු සිංහලට පරිවර්තනය කිරීම විද්‍යාලංකාර ත්‍රිපිටක සංගායනාවෙහි පරමාර්ථ විය.

අතිපූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්වාමින්ද්‍රයන් වහන්සේගේ අපවත්වීමෙන් සැට තුන් වසරක් සපිරුණු 1950 අගෝස්තු මස 15 වැනි දින ත්‍රෛනිකායික ගරුතර මහා සංඝ රත්නය විද්‍යාලංකාර පිරුවනට වැඩමවා අදියර තුනකින් යුතුව ත්‍රිපිටක සංගායනාව පැවැත්වීමට කටයුතු සම්පාදනය කෙරුණි. පළමු අදියරේ දී ලක්දිව සිසාරා සම්භාවනීය සහ පෞරාණික පුස්තකාලයන්ගෙන් ලබාගත් පුස්කොළ පොත් සහ සිංහල, සියම්, බුරුම, ඉංග්‍රීසි මුද්‍රිත පොත් සසඳමින් සජ්ඣායනා කරමින් පාඨාන්තර (විසංවාද සහිත ස්ථාන) රැස්කරන ලදි.

දෙවැනි අදියර ලෙස එක් එක් පොත් වෙනුවෙන් පත්කළ භාරකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේලා එක් රැස්වී එකී පාඨාන්තර සන්සන්දනය කොට වඩාත් යෝග්‍ය වූ පාඨ, අධොලිපි වශයෙන් යෙදිය යුතු පාඨාන්තර සහ වියත් සභාවක දී සාමූහික ව තීරණය කළයුතු බරපතළ පාඨ වෙන්කොට ගොනු කිරීමට තීරණය විය.

තෙවැනි අදියර ලෙස සංගීතිකාරක මණ්ඩලය සහ ඊට අතිරේක ව පිටින් වැඩමවන වියත් විසාරද හිමිවරුන් රැස්වී නියමිත දිනයක දී ප්‍රසිද්ධ සාකච්ඡා පවත්වා සංඝ සම්මතයෙන් ත්‍රිපිටකය සකස් කිරීමට තීරණය විය. මෙම මූලික අදියර තුන නිමවා ත්‍රිපිටකය සකස් වූ පසු ධර්ම විනයධර මහ තෙරුන්වහන්සේලා පන්සිය නමක් විද්‍යාලංකාරයට වැඩමවා, සම්පූර්ණ ත්‍රිපිටකය සජ්ඣායනා කොට ත්‍රිපිටක සංගායනාව හමාර කිරීමට තීරණය විය. සිංහල බසට ත්‍රිපිටකය පරිවර්තනය කිරීම අතුරු අරමුණක් විය.

දිනපතා පෙරවරු 8 සිට 10.30 දක්වා ද, පස්වරු 3 සිට 5.30 දක්වා ද, රාත්‍රී 9 සිට 11 දක්වා ද වශයෙන් දිනකට තුන් වතාවකදී පැය හත බැගින් ත්‍රිපිටක සංගීතිය පවත්වා තිබේ. 1950 අගෝස්තු 15 වන ආරම්භක දින සිට 1950 දෙසැම්බර් 30 දින දක්වා කාලයේ විනය පිටක සංගායනාව පවත්වා අවසන් වූ පසු 1951 ජනවාරි 6 වන දින ඇරඹුණු සූත්‍ර පිටක සංගායනාව 1952 ඔක්තෝබර් 20 වනදා රාත්‍රී 9.40ට අවසන් විය. 1952 නොවැම්බර් පළමුදින ආරම්භ කළ අභිධර්ම පිටක සංගායනාව 1954 පෙබරවාරි 16 වන දින රාත්‍රී 10.20ට අවසන් කෙරුණි.



ත්‍රිපිටක ධර්ම සංගීති අවස්ථාවෙහි විද්‍යාලංකාර පරිවේණාධ්‍යක්ෂ යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමි

දළදා මාලිගාවේ පත්තිරිප්පුව, මල්වතු විහාරය, අස්ගිරි විහාරය, පැල්මඩුල්ල රජමහා විහාරය, මුතියංගන රජමහා විහාරය, කැලණිය රජමහා විහාරය, බෙලිගල රජමහා විහාරය, කසාගල රජමහා විහාරය, වට්ටාරම රජමහා විහාරය, බෙලිගම්මන රජමහා විහාරය, වැලිගම අග්‍රබෝධි විහාරය, හුරුක්ගමුව විහාරය, රත්මලාන පුරාණ විහාරය, විද්‍යාලංකාර පුස්තකාලය, කොස්ගොඩ සිරිනිවේසාරාමය, පින්වත්තේ සද්ධර්මාකර පිරුවන, බෙන්තර වනවාස විහාරය, මාතර මහා මන්තින්ද පිරුවන ආදී වෙහෙර විහාරස්ථාන රාශියකින් ලබාගත් පුස්කොළ පොත් සහ මේ වන විට සිංහල, සියම්, බුරුම සහ ඉංග්‍රීසි අකුරුවලින් මුද්‍රණය කොට තිබූ පොත් මේ සඳහා උපයෝගී කරගෙන ඇත.

මල්වතු, අස්ගිරි, කෝට්ටේ පාර්ශ්වයන්හි මහා නා හිමිවරුන් සහ අනු නා හිමිවරුන්, පොල්වත්තේ බුද්ධදත්ත මහ නා හිමි, තෙල්වත්තේ අරියවංස මහ නා හිමි, විදුරුපොල පියතිස්ස මහ නා හිමි, පැළෑණේ වජිරඤාණ මහ නා හිමි, දීපේගොඩ චන්දවිමල මහ නා හිමි, විද්‍යෝදය පරිවේණාධිපති බද්දේගම පියරතන නා හිමි, වැලිවිටියේ පුඤ්ඤසාර නා හිමි ඇතුළු එම වකවානුවෙහි ලක්දිව ශාසන භාරධාරී ස්වාමීන්ද්‍රයන් වහන්සේලා විද්‍යාලංකාර ත්‍රිපිටක සංගායනාව සඳහා දායකත්වය ලබා දී ඇත.

මෙම සංගායනාවෙහි ප්‍රධාන සම්පාදක සහ සංවිධායක වශයෙන් කුඩිරිප්පුවේ ප්‍රඥාශේඛර හිමිපාණන් වහන්සේ කටයුතු කළහ. විද්‍යාලංකාර පරිවේණාධිපති නාහිමියන් ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය සංගීතිකාරක සභාවේ මුලසුන් ගත්හ. බඹරගල රාජමහා විහාරාධිපති ඔත්නාපිටියේ ධර්මපාල මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ සංගීතියෙහි මහතෙර පදවිය හෙබවූහ. දිවයින පුරා පැරණි විහාරස්ථානවල පොත්ගුල්වලින් පැරණි පුස්කොළ පොත් සොයා යාමට පරිවේණාධ්‍යක්ෂ යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමියෝ කටයුතු කළ අතර ඊට බෝගමුවේ සාරානන්ද හිමිපාණන් වහන්සේ සහ දෙනගම ධම්මාධාර හිමිපාණන් වහන්සේ සහය වූහ.

උඩුබද්දාවේ පුරාණ විහාරාධිපති දඹවින්නේ ධර්මානන්ද නාහිමියෝත්, බටපතේ විහාරාධිපති මාතලේ සරණංකර හිමියෝත්, මැටිකොටුවේ සුරේන්ද්‍රාරාමාධිපති කැරගල සෝමානන්ද හිමියෝත් වැඩිම කාලයක් මීට සම්බන්ධ වූ හිමිවරුන් ලෙස සඳහන් වෙයි.

දිනපතා රාත්‍රියේ සූත්‍ර පිටකයේ තෝරා ගත් කොටස් ගිහි පැවිදි පිරිස් ඉදිරියේ ධර්ම දේශනා කොට ධර්ම සාකච්ඡා පවත්වන ලදි. මෙම දේශනා "සභිබණ" දේශනා ලෙස හඳුන්වා ඇති අතර උගතුන් අතර ප්‍රචලිත ව පැවති ත්‍රිපිටකය වියත් සමාජයෙන් පිටත සිටියවුන් අතර ද ජනප්‍රිය කරවීමේ වැයමක් ලෙස හඳුන්වා දිය හැකි ය.

බුරුම රට සුප්‍රකට ඡට්ඨ සංගායනාව සඳහාද ආදර්ශයක් සැපයුවේ මෙම විද්‍යාලංකාර ත්‍රිපිටක සංගායනාවයි. මේ පිළිබඳ අදාළ ලිපි ලේඛන බුරුම රජය මගින් ලක්දිව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විද්‍යාලංකාර පිරුවන වෙත යොමු කොට ඇත. මෙම ධර්ම සංගායනාව දැක බලා ගැනීමට බුරුම රට ශාසන ඇමති යූ වින් මහතා ඇතුළු බුරුම දූත පිරිස් මෙරටට පැමිණි අතර වාර්ෂික ව බුරුම රජය මගින් විද්‍යාලංකාර පිරුවනට සහල් ටොන් දහස බැගින් පිරිනැමීමට කටයුතු කළේ ය.

ත්‍රිපිටක සංගායනාවෙහි සැලසුම පරිදි ප්‍රතිඵල ප්‍රකාශයට පත්වීමක් සිදු කොට නැත. විශේෂයෙන් 1956 වර්ෂයේ එළඹි සම්බුද්ධ පරිනිර්වාණයේ 2500 වසර සැමරුම් බුද්ධ ජයන්ති උත්සව අවස්ථාවෙහි රටෙහි විවිධ පාර්ශ්වයන්ගෙන් පැමිණි ඉල්ලීම් සලකා එවකට අග්‍රාමාත්‍ය ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා විසින් 1955 වසරේ ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයක් රජයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධ ව පිහිටුවන ලදී. මේ සමග ත්‍රිපිටක සංස්කරණ කටයුතුවලට දායක වූ අනෙක් පාර්ශ්වයන්හි පැවති උද්‍යෝගය හීන වී ගිය බව අනුමාන කළ හැක.

වර්ෂ 1950 අගෝස්තු 15 වන දින පටන් අවුරුදු තුනයි මාස පහයි දවස් පහළොවක් විද්‍යාලංකාර පිරුවනෙහි පැවති මෙම ත්‍රිපිටක සංගීති පුණ්‍යොත්සවය 1954 පෙබරවාරි මස 16වන දා අවසන් වී ඇත. කිසිදු රාජ්‍ය අනුග්‍රහයක් නොලබා ලක්දිව අග්‍රගණ්‍ය ප්‍රාචීන අධ්‍යයන ආයතනයකින් සිදු කළ ඉතා උසස් මට්ටමේ ශාස්ත්‍රීය වැයමක් ලෙස විද්‍යාලංකාර ත්‍රිපිටක ධර්ම සංගායනාව හඳුන්වා දිය හැකිය.

(මෙම ලිපිය සකස් කිරීමේදී පූජ්‍ය උඩගලදෙණියේ ධම්මවිමල හිමියන් සංස්කරණය කළ විද්‍යාලංකාර ත්‍රිපිටක ධර්ම සංගීති වාර්තාව උපකාරී වූ බව සඳහන් කර සිටිමි.)

**දිමුතු පුන්සර කොළඹගේ**

# මෙත්තා

## මහ රහත් තෙරණියගේ

## උදානය

**පෙර වැඩසිටි බොහෝ බුදුරජාණන් වහන්සේලාගේ බුදු සසුන ලොව බබළන කාලයේ මිනිස් ලොව ඉපිද නොයෙක් නොයෙක් මහා අනර්ඝ පින් රැස් කර ගත් මෙතුමිය විපස්සී බුදුරජාණන් වහන්සේගේ කාලයේ ක්ෂත්‍රිය කුලයේ එක්තරා බමුණු පවුලක දියණියක් ලෙස ඉපදුණා.**

ඉතාම රූප ශ්‍රීයෙන් යුතු මෙම තරුණිය දුටු ඒ නුවර බන්ධුමතී රජ්ජු ඔහුගේ අග මෙහෙසිය කර ගත්තා. ඇය තම රජතුමාට ඉතාම හිතෛෂී, පක්ෂපාති කුල කාන්තාවක් වුණා.

දිනක් ඇය හුදකලාවේ සිටින අවස්ථාවක මෙහෙම සිතුවා,

"මට දැන් පෙර පින් තිබෙන නිසා මෙසේ අග මෙහෙසිය ලෙස රජ සැප විඳිනවා. දැසි දස්සන්, වෙනත් සැප සම්පත් සිල්ලම මට තිබෙනවා. රජතුමාත් මට බොහෝ ආදරෙයි. කරුණාව යි. නමුත් යම් දවසක මට මේ සියල්ල ම අතහැර යන්න වෙනවා. ඒක ලෝක ස්වභාවය යි. නමුත් එසේ යන දවසට මම යන්න ඕනෑ තනියම යි. මේ තිබෙන කිසි දෙයක් මට ගෙනයන්න බැහැ. මම මරණයට පත්වෙලා මේ ලෝකයෙන් චුත වෙනකොට රැගෙන යන්න පිනක් මට නැහැනේ. මම මෙසේ සැප විඳිමින්, විනෝද වෙමින් ජීවත්වෙලා මිය ගියොත් ඒකාන්තයෙන් ම කටුක වූ ත්, ඝෝර වූත් අතිශය දරුණු වූ නිරයට යාමට සිදුවන බව නම් ඒකාන්ත යි. එහි සැකයක් නම් නැහැ. ඒ නිසා මමත් මගේ ජීවිතයට පින් කර ගන්න ඕනෑ" යි සිතා රජ්ජුවෙත ගොස්,

"රජතුමනි, ඔබ වහන්සේගෙන් උපකාරයක් බලාපොරොත්තුවෙන් ආවෙමි. මේ ජීවිතයේ මම කිසිදු පිනක් කර ගත් තැනැත්තියක් නොවේ. ඒ නිසා දිනපතා දන් පූජා කිරීමට මට එක් භික්ෂූන් වහන්සේ නමක් ලබාදෙනු මැනව" යි ඉල්ලා සිටියා.

රජතුමා ධර්මාවබෝධය කළ භික්ෂූන් වහන්සේ නමක් වෙත දන් පිළි ගැන්වීමට අවසර ලබා දුන්නා. ඇය පළමු දිනයේ දී උන්වහන්සේගේ පාත්‍රය ගෙන රසවත් අහරින් පුරවා බොහෝ වටිනා වස්ත්‍ර දෙකකින් පාත්‍රය වසා ඒ ස්වාමින් වහන්සේට පිළිගැන්වූවා. ඉන්පසු ඇය දිනපතා මහත් ශ්‍රද්ධාවෙන් දානය පිළියෙළ කර උන්වහන්සේට පූජාකළ අතර, ඒ පින නිතර නිතර සිහි කරමින් සතුටු වුණා. පසු කලෙක ඇය මිය ගොස් තව්තිසා දෙව්ලොව උපත ලැබුවා.

සිතන, පතන හැම දෙයක් ම ඇයට ලැබුණා. අප සම්මා සම්බුදු ගෞතම බුදුරජාණන් වහන්සේගේ බුදු සසුන බබළන කාලයේ ඇය නැවත මනු ලොව ඉපදුණා. තරුණ කාලයේ දීම ඇයට ගිහි ගෙදර කළ කිරුණා. පැවිද්දට සිත ඇලුණා. භික්ෂුණී ආරාමයක දී පැවිද්ද ලබා ගත්තා. වීර්යය ඇති එතුමිය, නොබෝ කලකින් සියලු බැඳීම්වලින් මිදුණා. සංයෝජන දුරු කළා. සියලු පවු දුරු කළා. බවයෙන් නිදහස් වුණා. එතුමිය නිතර නිතර මෙසේ සිහිකළා.

"මම මෙයින් කල්ප අනූ එකකට පෙර යම් දානයක් දුන්නා ද, ඒ පින හේතුවෙන් දුගතියකට නම් ගියේ නැහැ. පිණ්ඩපාතික දානයේ එල විපාක නම් අඳුරු වුණේ නැහැ. ඒ පිනම හේතු කරගෙන මම ශාස්තෲන් වහන්සේගේ ඔවදන ඉටුකළා.

දිනක් උන්වහන්සේ හුදකලාවේ වැඩ වෙසෙන මොහොතක නිරායාසයෙන් උදානයක් වදළා.

**"ඉස්සර මම සිල් රැක්කේ දන් දුන්නේ දිව්‍ය ලෝකයේ ඉපදෙන්නට ප්‍රාර්ථනා කරමින්. මම ඒ සැපයට ආශා කළා.**

**නමුත් දැන් මම සියලු දුක් අවසන් කළ භික්ෂුණියක්.**

**දැන් දානය වළඳන්නේ එක වරුව යි. හිස මුඬු කරගෙන පාත්‍රා සිවුරු ඇතිවයි ඉන්නේ.**

**මා තුළ තිබූ සියලු කෙලෙස් දුරුකළ නිසා දැන් සුවසේ වැඩ වාසය කරනවා.**

**නැවත කිසි දිනෙක මා දිව්‍ය ලෝකයක උපත පතන්නේ නැහැ.**

**නයනා නිල්මිණී**

# පූජනීයත්වයට පාත්‍ර වූ අටවිසි බෝධීන් වහන්සේ

අටවිසි බෝධි පුරාණය 07

## සුමේධ බුදුරජාණන් වහන්සේ

කොළොම් බෝධිය (බක්මී)



**බෝධි තස්ස භගවතෝ මහානිපෝති වුච්චති**

ඒ භාග්‍යවතුන්ගේ බෝධිය කොළොම් රුක යැයි කියනු ලැබේ. මෙම බෝධිය බක්මී ගස වශයෙන් සද්ධර්මරත්නාවලියෙහි අර්ථ දක්වා ඇත.

## සුජාත බුදුරජාණන් වහන්සේ

මහ උණ බෝධිය



**බෝධි තස්ස භගවතෝ මහා මේලුති වුච්චති**

ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය මහ උණ යැයි කියනු ලැබේ යනුවෙන්. බුද්ධ වංශ පාලියෙහි 144- 145 පිටුවෙහි සඳහන් වේ.

## පියදස්සී බුදුරජාණන් වහන්සේ

කුඹුක් බෝධිය




**බෝධි තස්ස භගවතෝ කකුධෝති පවුච්චති**

ඒ භාග්‍යවතුන්ගේ බෝධිය කකුසධ යැයි බුද්ධ වංශ පාලියෙහි 150, 151 පිටුවල අන්තර්ගත වේ.

## අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ

සපුබෝධිය



**බෝධි තස්ස භගවතෝ චම්පකෝති පවුච්චති**

ඒ භාග්‍යවතුන්ගේ බෝධිය සපු යැයි කියනු ලැබේ. යනුවෙන් බුද්ධවංශ පාලියෙහි 156 – 157 පිටුවෙහි ඇතුළත් වේ.

## ධම්මදස්සී බුදුරජාණන් වහන්සේ

රත්කරව් රුක් බෝධිය



**බෝධි තස්ස භගවතො බිම්බිජාලෝති වුච්චති**

ඒ භාග්‍යවතුන්ගේ බෝධිය රත්කරව් රුක යැයි කියනු ලැබේ යනුවෙන් බුද්ධ වංශ පාලියෙහි 162 – 163 පිටුවෙහි සඳහන් වේ. සද්ධර්මරත්නාවලියෙහි කුඹුක්ගස බෝධිය වූයේ යැයි යනුවෙන් සඳහන් වෙයි. සද්ධර්මාලංකාරය කිණිහිරි බෝධි මූලය වශයෙන් එය හඳුන්වා ඇත.

## සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ

කිණිහිරි බෝධිය



**බෝධි තස්ස භගවතෝ කණිකාරෝති වුච්චති**

ඒ භාග්‍යවතුන්ගේ බෝධිය කිණිහිරි යැයි කියනු ලැබේ. යනුවෙන් බුද්ධ වංශ පාලියෙහි 168, 169 පිටුවල සඳහන් වේ.

## තිස්ස බුදුරජාණන් වහන්සේ

පියා බෝධිය (කොහොඹ)



**බෝධි තස්ස භගවතෝ අසනෝති පවුච්චති**

ඒ බුදුන්ගේ බෝධිය පියා රුක් යැයි කියනු ලැබේ. යනුවෙන් බුද්ධ වංශ පාලියෙහි 174 – 175 පිටුව සඳහන් වේ. ඇඹුලු බෝමුල් හී තණ සලා වගුරුවා යනුවෙන් සද්ධර්මාලංකාරයෙහි මෙය අර්ථ දක්වා ඇත.

**හේමමාලා රන්දුනු**


# ප්‍රහේලිකා අංක 14

බුදුසරණ

ත්‍යාග අනුග්‍රහය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**




### හරහට

1. තම රූ සපුව ගැන මානයෙන් බුදුරදුන් ඉදිරියට යාමට මැලි වූ කුමරියයි.
5. දයකයින් මාසික ව ගමේ විහාරස්ථානයට පුදනු ලබන දනය මෙනමින් හැඳින්වෙයි.
6. ගමේ බෞද්ධයින් පුදපූජා සඳහා රැස්වන මධ්‍යස්ථානයයි.
7. හින්දු ආගමේ සඳහන්වන ප්‍රධාන දෙවිකෙනෙකුගේ නමයි
9. ආයුර්වේදයෙහි එන දියර ප්‍රතිකාරකයකි.
11. බුදුන් වහන්සේ සුර අසුර යුද්ධය ගැන මෙම සූත්‍රයෙහි දී සඳහන්කර වදරති.

### පහළට

2. තම රූ සපුව ගැන පලකළ මතය ගැන මෙම බමුණු දියණිය බුදුරදුන් කෙරෙහි වෛර බැඳගත්තා ය.
3. රජ මැදුරට යෙදෙන නමකි.
4. බුද්ධාදී අටතැනක් ගැන මෙවන් සිතිවිලි ඇතිවීම ද නීවරණයකි.
8. "පරිච්ඡේද" යන්න සඳහා භාවිත කරන තවත් නමකි.
9. දගැබක බිම් මට්ටමේ ඇති වළලු තුන මෙනමින් හැඳින්වෙයි.
10. අකුසල්වල විපාක වශයෙන් නිරයෙහි දී මේවා විඳින්නට සිදුවෙයි.

**පිරුවානා පොත් වහන්සේ, සප්ත බොජ්ඣංගය, මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචිත බුදුන් වදාළ ධර්මය ඇතුළු ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

# දහමෙන් දැමුණු නිගණ්ඨ සච්චක පසු භවයක දී රහත් ඵලයට

**තථාගතයන් වහන්සේ වැඩ සිටි කාලයේ වෛශාලි පුරයේ සච්චක නම් නිගණ්ඨ පුත්‍රයෙක් විසුවා. මව්පියන්ගෙන් වාද කරන්නට ඉගෙන ගත් ඔහු, පඬිවරයෙක්. ඒ වගේ ම ලිච්ඡවි කුමාරයන්ගේ ගුරුවරයා ද වුණා. තමා තරම් දන්නා, තමන් හා වාද කිරීමට සමත් මේ ලෝකයේ කවුරුත් නැතැයි ඔහු තමා ගැන මාන්නයකින් සිටියා.**

ඔහු වෛශාලියේ ජනයා මැද "මා හා වාද කළහොත් වෙවුලා නො යන, කිසිලිවලින් ඩහදිය නො වැගිරෙන පණ්ඩිතයෙක්, ගණාචාරවරයෙක්, සම්මා සම්බුදු යැයි කියා ගන්නා කෙනෙක් මිහිපිට නැහැ. මා හා වාද කළොත් ඔහු වෙව්ලා යනවා. ඔහුගේ කිසිලිවලින් ඩහදිය ගලනවා" යැයි නිතර පුරසාරම් දෙඩනවා.

දිනක් ඔහු තමන්ගේ හපන්කම් පෙන්වනු පිණිස පන්සියයක් ලිච්ඡවීන් ද කැඳවාගෙන බුදුරජාණන් වහන්සේ මුණ ගැසීමට කූටාගාර ශාලාවට ගියා. එළිමහනේ සිටි භික්ෂූන් වහන්සේ දැක සච්චක අසනවා,

"ස්වාමීනි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ කොයි වැඩ සිටී ද?"

"මහ වනයේ කූටාගාරයේ ගසක් මුල තථාගතයන් වහන්සේ වැඩ සිටිනවා"

සච්චක වාදයකට පැමිණෙන බවත්, ඔහු දමනය වන බවත් භාග්‍යවතුන් වහන්සේ දුටු සේක. උන්වහන්සේ අසලට ගිය සච්චක ඒ අසලින් අසුන් ගෙන වාදයකට මෙන් කතාවක් පටන් ගත්තා. බුදුරජාණන් වහන්සේ ඔහුගේ වාදයෙහි නිසරු බව දක්වා ඔහු පරාජිතයකු බවට පත් කළා. සච්චක පරාජය පිළිගෙන කිසිවක් කර කියා ගත නො හැකිව ලජ්ජාවෙන් බිම බලා ගත්තා. ඉන්පසු ඔහු,

"පින්වත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේ හා වාදයට ආ අපි ම වරදකරුවෝ වෙමු. මද කිපුණ ඇතෙකු හා ගැටෙන්නට යන කාටවත් සෙතක් වන්නේ නැහැ. ඝෝර විෂ සහිත සර්පයකු හා ගැටුණ අයෙකුට යහපතක් සිදුවන්නේ නැහැ. ඒ වගේ ගෞතමයන් වහන්සේ හා වාදයකට ආ අප කළේ බලවත් වරදක්. මට සමාවන සේක්වා! හෙට දිනයේ ඔබ වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලා සමග මගේ නිවසට දානය පිණිස වඩින සේක්වා!" කියා ආරාධනාවක් ද කර පිටව ගියා. සච්චක ධර්මය ඇසුව ද, ඔහුගේ නුවණ මෝරා තිබුණේ නැහැ. නමුත් අනාගතයේ දී ඔහු ලක්දිව ඉපදී රහතන් වහන්සේ නමක් බවට පත්ව බුදුසසුන බබළ වන බව භාග්‍යවතුන් වහන්සේ දුටු සේක.

සච්චක මිය පරලොව ගොස් චුත ව දෙව්ලොව උපන්නා. ලක්දිව බුදු සසුන පිහිටියාට පසු ඔහු දෙව් ලොවින් චුත ව දක්ෂිණාගිරි විහාරාසන්නයෙහි ඇමති පවුලක උපන්නා. සුදුසු වයසට ආ කල්හි ඔහු ගිහි ගෙදරින් නික්ම පැවිදි වුණා.

උන්වහන්සේ කාලබුද්ධරක්ඛිත නම් වුණා. ත්‍රිපිටකයත්, විනයත් මැනවින් ඉගෙන ගෙන දිනක් තමන් වහන්සේගේ උපාධ්‍යයන් වහන්සේ මුණ ගැසීමට පැමිණියා. නමුත් උපාධ්‍යායන් වහන්සේ කාලබුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ හමුවීම මඟහැරියා. වචනයක් හෝ කතා කළේ නැහැ. පසුදින උදෑසන ම බුද්ධරක්ඛිත හිමි උපාධ්‍යායන් වහන්සේ වෙත ගොස් වැඳ

"ස්වාමිනි, මම ත්‍රිපිටක ධර්මය ඉගෙනීම අවසන් කර ඔබ වහන්සේ දැකීමට පැමිණියෙමි. නමුත් ඔබ වහන්සේ මට මුහුණ නො දෙයි. පිළිසඳර කතා නො කරයි. මා අතින් සිදු වූ වරද කුමක් ද?"

"බුද්ධරක්ඛිත, ත්‍රිපිටකය උගත් පමණින් පැවිදි බව සම්පූර්ණ වන්නේ නැහැ"

"ස්වාමිනි, එසේනම් කුමක් කළ යුතු ද?"

"බුද්ධරක්ඛිත, කුසිතපබ්බත විහාරයට ගොස් බුදු සසුන සම්පූර්ණ කර ගන්න."

උපාධ්‍යායන් වහන්සේගේ අවවාදය පිළිගත් උන් වහන්සේ වීර්ය කොට අරහත්වයට පත්වූ සේක.



ස්වාමිනි, කළුවර දවසක, කාළබුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ, කළු තිඹිරි ගසක් මුල කාළකාරාම සූත්‍රය වදාළ බව මම මතකයේ තබා ගන්නෙමි

අනන්ත වූ බුදු ගුණ අනන්ත ආකාශයට උපමා කිරීම ඉතා යහපත්. ඔබ වහන්සේට සුදුසු පූජාවක් මා සතුව නැහැ. එනිසා මේ ලක්දිව මම ඔබ වහන්සේට පූජා කරනවා.

ඒ කාලයේ සද්ධාතිස්ස රජතුමා සිල් සමාදන් ව සෑගිරියේ වාසය කළා. කාලබුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ දහම් දෙසයි නම්, ප්‍රශ්න විසඳයි නම් මට දන්වන්න" කියා තෙරුන් වහන්සේගේ උපස්ථායකට කියා තිබුණා. එක් අමාවක දිනක දී කාලබුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ භික්ෂු සංඝයාවහන්සේ සමඟ කළු තිඹිරිගසක් මුල වැඩ සිටියා. එහිදී එක් භික්ෂූන් වහන්සේ නමක් උන්වහන්සේගෙන් කාළකාරාම සූත්‍රයෙන් ප්‍රශ්නයක් විමසුවා. එදින දහම් දෙසන දිනයක් බැවින්, බුද්ධරක්ඛිත රහතන් වහන්සේ රාත්‍රිය මුළුල්ලේ ම කාළකාරාම සූත්‍රයෙන් දහම් දෙසූ සේක. එම දේශනාව කරන අතරේ මහ පොළොව කම්පා වුණා. පන්සියයක් භික්ෂූන් වහන්සේ අරහත්වයට පත්වුණා.

කාලබුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ දහම් දෙසන බව උපස්ථායක විසින් තිස්ස රජුට දැනුම් දුන්නා. රජතුමා දහම් අසනු සඳහා එහි ගොස් අප්‍රසිද්ධියේ පිරිසේ කෙළවරක සිටගෙන රාත්‍රිය මුළුල්ලේ ම ධර්මය ශ්‍රවණය කළා. රහතන් වහන්සේ දේශනාව අවසන් කරනවාත් සමගම රජතුමා සාධුකාර දුන්නා.

"මහරජ, කොයි වෙලාවේද මෙහි ආවේ"

"ස්වාමීනි, ඔබ වහන්සේ පූර්ව ගාථා වදරා අවසන් වනවිට ම වගේ මම විහාරයට පැමිණියේ"

"මහරජ තුන්යම පුරාම ඔබ සිටගෙනම දහම් ඇසීමෙන් ඉතා දුෂ්කර දෙයක් සිදුකළේ"

"ස්වාමීනි, එය දුෂ්කර දෙයක් නොවේ. ඊට වඩා දුෂ්කර වූයේ ඔබ වහන්සේ වදාළ හැම දහම් කරුණක් ම මම හොඳින් අසා මතකයේ තබා ගැනීමයි".

ඉන්පසු රජතුමා අසනවා,

"ස්වාමීනි, ඔබ වහන්සේ වදාළ බුදුගුණ මෙ පමණ ද? නැතිනම් තව තිබෙනවා ද?"

"මහරජ, මා කී බුදුගුණවලට වඩා නො කී බුදුගුණ ඉතා බොහෝ යි,

"ස්වාමීනි, උපමාවක් වදාළ මැන"

"මහරජ, ජලය පිරී දෙගොඩතලා ගලා යන මහා ගංගාවකට ඉඳිකටුවක් ඇල්ලුවොත් එහි මලින් යන ජලය යම් සේ ඉතා මඳ වේ ද, ඉතිරි ජලය බොහෝ වේ ද, එමෙන් මා කී බුදුගුණ ස්වල්පය යි. නො කී බුදුගුණ බොහෝ යි"

"ස්වාමීනි, තව උපමාවක් වදාළ මැන"

"මහරජ, අහසෙහි ඉගිලෙන ලිහිණින් සිටිනවා. ඔවුන් පියාසර කරන විට පියාපත්වලට වැසෙන අහස ද වැඩි? ඉතිරි අහස ද වැඩි?"

"ස්වාමිනි, ලිහිණියාගේ පියාපත්වලට වැසෙන අහස ඉතා මඳයි. නො වැසෙන අහස ම ඉතා බොහෝ යි"

"රජතුමනි, එමෙන් ම මා කී බුදුගුණ ඉතා මඳයි. නො කී බුදුගුණ ඉතා බොහෝ යි. අනන්තයි, අප්‍රමාණයි" යි තෙරුන් වහන්සේ වදාළ සේක.


"ස්වාමිනි, අනන්ත වූ බුදු ගුණ අනන්ත ආකාශයට උපමා කිරීම ඉතා යහපත්. ඔබ වහන්සේට සුදුසු පූජාවක් මා සතුව නැහැ. එනිසා මේ ලක්දිව මම ඔබ වහන්සේට පූජා කරනවා. මේ දහම් පඬුර භාර ගන්නා සේක්වා!."

"මහරජ, ඔබගේ පැහැදීමට අප ප්‍රශංසා කරනවා. අපට දුන් මේ රාජ්‍යය අපි නැවත ඔබට ම දෙමු. දැහැමින් මේ රට පාලනය කරන්න" තෙරුන් වහන්සේ රජුට වදාළා.

"ස්වාමිනි, කළුවර දවසක, කාළබුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ, කළු තිඹිරි ගසක් මුල කාළකාරාම සූත්‍රය වදාළ බව මම මතකයේ තබා ගන්නෙමි" යි කී රජු උන්වහන්සේට වන්දනා කර නික්ම ගියා.

නයනා නිල්මිණී

උදර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය, සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පිරිවෙන් හා ආගමික විෂය භාර විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අමරපුර මහා නිකායේ රාස්සගල පාර්ශ්වයේ මහානායක කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහ නා හිමිපාණන් වහන්සේ ය.



# භික්ෂු ගරුත්වයට හිමි

## පූජනීයත්වයෙන් හා උදරත්වයෙන් පිරිපුන්

## කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහ නා හිමි


**අපේ හාමුදුරුවනේ, ඔබ වහන්සේ ළමා කාලයේ දී ම පැවිදි වීමට හේතු වූ මූලික පසුබිම සකස් වුණේ කුමන ආකාරයෙන් ද?**

මම 1946 වර්ෂයේ ඔක්තෝබර් පළමුවෙනිදා මාතර කරගොඩ උයන්ගොඩ නම් ස්වභාවික සෞන්දර්යයෙන් අනූන ප්‍රදේශයක උප්පත්තිය ලැබුවා. එවකට ගමේ ජීවත්වුණු සියලු ගම්වැසියන් අන්‍යෝන්‍ය සුහදතාවයෙන් ඉතාමත් සැනසිලිදායක ලෙස ජීවත්වුණු පිරිසක් බව ප්‍රකාශ කළ යුතු යි. ඒ වගේම නිවස ඉදිරිපිට තිබෙන කෙළවරක් නොපෙනෙන කුඹුරු යායේ අස්වැන්න නෙළා ගැනීමෙන් අනතුරුව ගමේ සියලුම ළමයින් ඒකරාශී කර ගනිමින් මිත්‍රශීලී ව සෙල්ලම් කරමින් කෙළිදෙළෙන් ගත කළ ළමා කාලය සිහිපත් කරන්නේ ඉතාමත් සතුටින් වර්තමාන දරු පරපුරට එවැනි අද්දැකීම් අත්විඳීමට ලැබීමේ අඩු ප්‍රවණතාවයක් මේ වන විට උදාවෙලා තිබීම කනගාටුවට කරුණක් බව ප්‍රකාශ කළ යුතුයි.

මාගේ ආදරණීය පියාණන් වන ඩී.එස්. අබේවික්‍රම වීරමන් හා ආදරණීය මැණියන් වන මුණසිංහ වික්‍රමරත්න වීරමන් යන මව්පිය දෙපළ ගත කළ ආදර්ශවත් ජීවිතය ළමා කාලය තුළ යහපත් ගුණධර්ම පෝෂණය කර ගැනීමට බෙහෙවින් උපකාර වුණා. සෑම පසළොස්වක පොහොයකදී ම මැණියන් සමඟ පන්සලට යාමත්, මැණියන් සමඟ නිවස තුළ බුද්ධ වන්දනා කිරීමත් කුඩා අවධියේදී ම පුරුදු වුණු සිරිතක් . මැණියන් හා පියාණන් ගත කළ උදර ජීවිතය ආගමික චාරිත්‍ර පිළිබඳ නිවැරැදි පුහුණුවක් ඇති කළා.

කරගොඩ උයන්ගොඩ මහා විද්‍යාලය, හා අනගාරික ධර්මපාලතුමා ආරම්භ කළ මහාබෝධි මහා විද්‍යාලය තුළින් මූලික අධ්‍යාපනය ලැබුවා. කුඩා කාලයේ සිටම ගුරුවරුන් කෙරෙහි දැක් වූ අසීමිත ගෞරවයත්, භක්තියත් නිසාම ගුරුවරුන් ලබා දුන් අවවාද පිළිගෙන ඒ ආකාරයෙන්ම කටයුතු කිරීමට වගබලා ගත්තා. ආදර්ශවත් මව්පියන්ගේ ආභාසයත්, උදර ගුරුවරුන්ගේ ඇසුරත් ගුණධර්මවලින් පරිපූර්ණ වූ ළමා අවධියක් උරුම වීමට ප්‍රබල සාධකයක් වූ බව සිහිපත් කළ යුතු යි.

මහාබෝධි විද්‍යාලයේ අධ්‍යාපනය ලබන කාලය තුළ බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නාහිමිපාණන් වහන්සේගේ ඇසුර ලබා ගැනීම ජීවිතයේ ලැබුණු භාග්‍යයක් කොට සලකන්න පුළුවන්. ඒ අවධිය වන විට උන්වහන්සේ කොළඹ මාලිගාකන්ද පාරේ මහාබෝධි මන්දිරය තුළ වැඩ සිටිමින් විද්‍යෝදය විශ්වවිද්‍යාලය තුළ ඉගැන්වීම් කටයුතු කළා. උන්වහන්සේ නිතර ඇසුරු කිරීමට ලැබීමත් සමඟ නිතරම පොත පත පරිශීලනය කිරීමට හුරු වූවා වගේම කාලයාගේ ඇවෑමෙන් පැවිදි වීමේ ආසාවත් නිරායාසයෙන්ම ඇති වුණා. ඒ අනුව බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නායක මාහිමිපාණන් වහන්සේගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් 1962 වර්ෂයේ ජූනි 18 වෙනි දින උතුම් වූ ප්‍රව්‍රජ්‍යාභාවයට පත් වුණා.




**ඔබ වහන්සේගේ පැවිදි ජීවිතයේ සාර්ථකත්වයට මෙන්ම අධ්‍යයන කටයුතුවලට වියත් පඬිවරුන්ගේ ඇසුර බලපෑවේ කුමන ආකාරයෙන් ද?**

බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නායක මාහිමිපාණන් වහන්සේ නිතරම පොත පත පරිශීලනය කරමින් ශාස්ත්‍රීය කටයුතුවල නිරතවුණු මහා යතිවරයාණන් වහන්සේ නමක් වශයෙන් කටයුතු කළ ආදර්ශවත් ජීවිතය අත්විඳීමට ලැබීම හා උන්වහන්සේගෙන් ලැබුණු ආභාසය සම්පූර්ණයෙන්ම පැවිදි ජීවිතයේ සාර්ථක බවට ඉවහල් වුණා. විෂය දැනුමට පරිබාහිර වූ බොහෝ දැනුම ලබා දීමට උන්වහන්සේ ක්‍රියා කළ ආකාරය කෘතවේදී ව සිහිපත් කළ යුතු යි. ඇතැම් දිනවලදී පිණ්ඩපාතය වැඩම කිරීමට පවා උපදෙස් ලබා දෙමින් පුරුදු කළා. ඉතාමත් නිහතමානී සැහැල්ලු අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට හුරුපුරුදු වුණු උන් වහන්සේගේ චරිතාපදානය මට සැහැල්ලු පැවිදි ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදා කළා.

ඒ වගේම දඹවින්නේ සුමනසාරාභිධාන නායක මාහිමිපාණන් වහන්සේ යටතේ සුධර්මාලංකාර පිරිවෙනින් අධ්‍යාපන කටයුතුවල නිරතවන අවධිය තුළත් විෂය දැනුමට පරිබාහිරව උන්වහන්සේගෙන් බොහෝ දැනුම් සම්භාරයක් ලබා ගැනීමට හැකි වුණා. පන්ති සාමාර්ථයක් සහිතව ප්‍රාචීණ, මධ්‍යම විභාගයෙන් සමත් වුණා වගේම ප්‍රාචීණ මධ්‍යමයත් අවසන් කරමින් උසස් පෙළ සමත් කරගෙන 1967 වර්ෂයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණා. එහිදී දර්ශනය පිළිබඳව ගෞරව උපාධිය ලබා ගත්තා. ඒ කාලය තුළ මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර, මහාචාර්ය කේ.එන්. ජයතිලක, මහාචාර්ය ඩබ්ලිව්.එස්. කරුණාරත්න වැනි වියතුන් ඉතා සමීපව ඇසුරු කිරීමට ලැබීමත් ජීවිතයේ එක් සන්ධිස්ථානයක් සනිටුහන් කළ බව ප්‍රකාශ කළ යුතු යි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භික්ෂු සංසදයේ සභාපති හා ලේකම් වශයෙන් වසර ගණනාවක් අඛණ්ඩව ක්‍රියාකාරීව කටයුතු කිරීමේ අවස්ථාව උදා වුණා. එහිදී ශිෂ්‍ය උද්ඝෝෂණ පැවැති සෑම අවස්ථාවකදීම භික්ෂුත්වයට හානියක් නොවන අයුරින් භික්ෂුව තුළ පැවැතිය යුතු සංවර බව හා සංයත බව ආරක්ෂා කරගෙන ජයග්‍රහණය කරා ළඟා විය යුතු බව තීරණය කරමින් ඒ අනුව කටයුතු කළා. අපහාස උපහාසවලින් තොරව සියලු දෙනාගේ ප්‍රසාදය දිනාගෙන ක්‍රමානුකූලව ඉල්ලීම් දිනා ගැනීමට කටයුතු කිරීම ඇතැම් විට වර්තමාන ශිෂ්‍ය පරපුරටත් ආදර්ශයක් ලබා ගත හැකියි.

විශ්ව විද්‍යාල නේවාසිකාගාරවල වාර්ෂිකව පිරිත් දේශනා පවත්වමින් මාසිකව ධර්ම දේශනා පවත්වමින් වසර ගණනාවක් අඛණ්ඩව ආගමික කටයුතුවල නියැළුණා පමණක් නොවෙයි, මහනුවර රෝහලට අවශ්‍ය කරන භාණ්ඩ පරිත්‍යාග කිරීමේ වාර්ෂික වැඩසටහනක් අඛණ්ඩ ව ක්‍රියාත්මක කළා. ඒ ආකාරයෙන් විශ්වවිද්‍යාල තුළත් ඉන් පරිබාහිරවත් ආගමික මෙන්ම සමාජ මෙහෙවරක යෙදීමට කටයුතු කරමින් භික්ෂු ගරුත්වයට හානියක් නොවන ආකාරයට ශිෂ්‍ය ඉල්ලීම් දිනාගත් බවත් සිහිපත් කළ යුතු යි. ඒ වගේම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයේ කථිකාචාර්යවරයෙකු වශයෙන් වසර ගණනාවක් සේවය කළා.

**ඔබ වහන්සේගේ ආගමික, සමාජීය, හා ශාස්ත්‍රීය සේවාව පිළිබඳව පැහැදිලි කරනවා නම්,**

බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නාහිමිපාණන් වහන්සේගේ ඉල්ලීමකට අනුව 1974 වර්ෂයේදී ශිෂ්‍යයන් 800 ක් පමණ ප්‍රමාණයක් අධ්‍යාපනය ලබමින් සිටි බලංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන භාර ගැනීමට සිදු වුණා. එහි අධ්‍යාපනය හදාරන ළමුන් වෙනුවෙන් කෘෂි විද්‍යාගාරයක්, නැටුම් අංශයක්, සංගීත අංශයක්, ක්‍රීඩා අංශයක්, වගේම බාල දක්ෂ ව්‍යාපාරයක් ආරම්භ කළා. වර්තමානය වන විට විශාල සිසු පිරිසක් අධ්‍යාපනය ලබන ස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා.

1992 වර්ෂයේදී සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව පිරිවෙන් අධ්‍යක්ෂ වශයෙන් පත් වීමත් සමඟ 2006 දී විශ්‍රාම යනතෙක් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල කාර්යයක් ඉෂ්ටකළා. ඒ අතර ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්, ශිෂ්‍යනායක පුහුණු වැඩසටහන්, විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කළා.

ශාස්ත්‍රීය වශයෙන් ග්‍රන්ථ රාශියක් රචනා කිරීමට කටයුතු කළා සේ ම බොහෝ ශාස්ත්‍රීය ලිපි පුවත්පත් සඟරාවල පළ කිරීමට කටයුතු කර තිබෙනවා. “මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය”, “සැලෙන සිතට සමාධි සුවය” , “ඔබේ සිතට සමාධි සුවය”, “මෙත් සිසිලෙන් සිත් සැනසේ” ආදී ග්‍රන්ථවලට අමතරව දර්ශනය හා මනෝ විද්‍යාව සඟරාව, හා ප්‍රතිභා සඟරාව රචනා කළා. වයස අවුරුදු 18 දී බුද්ධ ගජ්ජය හා සකස්කඩය නැමැති ග්‍රන්ථය සංස්කරණය කළ බව සිහිපත් කළ යුතුයි.

සෑම වර්ෂයක් පාසා අඛණ්ඩව ජන්ම දිනය නිමිත්තෙන් ගැබිනි මාතාවන් වෙනුවෙන් පෝෂණ මල්ලක් සහිතව මුදල් පරිත්‍යාග ලබා දීමටත් වර්ෂයක් පාසා අඛණ්ඩව විශ්වවිද්‍යාල අධ්‍යාපන ලබන තෝරාගත් සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීමටත් අධ්‍යාපනය ලබන දරුවන් ප්‍රමාණයකට මාස්පතා ශිෂ්‍යත්ව මුදලක් ලබා දීමත් සිදු කරනවා. සබරගමු විශ්වවිද්‍යාල පාලක සභාවේ සභාපතිත්වය දරමින් ක්‍රියාකාරීව කටයුතු කරනවා වගේම ආගමික හා ශාසනික සේවාවන් වෙනුවෙන් විවිධ පාර්ශ්වයන්ගෙන් සම්මාන උපාධි පිරිනමා තිබෙන බව සිහිපත් කළ යුතුයි.

හේමමාලා රන්දුනු

# නෞකාව දම් අමා වඳිමි නමා නළල් තලේ

බොදු ගීයක මිහිර



**මෙම ගීතයෙන් තෙරුවන් වන්දනාව මනාව අර්ථාන්විත ය. මෙහි ගායනය සහ වාදනය මහාචාර්ය සනත් නන්දසිරිගෙනි. ගී පද ආචාර්ය අජන්තා රණසිංහයන්ගෙනි.**

මෙම කලාකරුවන් දෙදෙනාගේ මෙහෙවරින් ගීතයෙන් ගලා යන භක්ති රසය බොදු සිත පහන් වීමට සමත් ය. ගීතයට යොදා ඇති සරල බස් වහර කදිම ය. මහාචාර්ය සනත් නන්දසිරිගේ ගායනයෙන්, එයටම සරිලන මියුරු සංගීතයෙන් ගීත රසය ඔපවත් ය.

ගීතයෙන් පළමුව අසන්නාගේ සිත පහන් කරන්නේ බුද්ධ වන්දනාවෙනි. 'බුද්ධත්වය' ලොවේ ඇති උත්තරීතරම පදවිය යි. ඒ උදෙසා උන් වහන්සේ සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා ඇප කැප වූ අයුරු විශිෂ්ඨ ය. උන් වහන්සේගේ ගුණ කදම්භය අසම සම ය. කෙතරම් උසැති පුද්ගලයෙකුට වුව ද ශ්‍රී දේහයේ ශීර්ෂ මුදුන දර්ශනය නොවන බව ධර්මයේ සඳහන් ය. එවන් රූප ශ්‍රියාවකින් බබළන, ආශ්චර්යවත් ගුණවත් උත්තමයෙක් තුන් ලෝ තලයේ ම නැති බැවින් උන්වහන්සේ අසම සම ය.

රජ මැඳුරේ සිට ම රොඩී පැල්පත දක්වාම උන් වහන්සේගේ ගුණ කදම්භය විහිදී ගියේ මහා කරුණාවෙනි. ඒ අමා මෑණී බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් නිර්වාණය ගීතයෙන් උපමා කර ඇත්තේ 'ස්වර්ණ වර්ණ ද්වාරයකට' ය. ඒ රන් දෙරටුවෙන් එතෙර වූ මනු ලොව, දෙව් ලොව, බඹ ලොව තුන් ලෝ සත්වයන් අපමණ ය. මෙම ගීතයෙන් බුදුන් වහන්සේ හඳුන්වන්නේ 'සම්බෝධිරාජ' නාමයෙනි. සිංහල සාහිත්‍යයේ බුදුන් වහන්සේ වෙනුවෙන් යොදා ඇති විශේෂණ පද රාශියකි. නව අරහාදී බුදු ගුණයෙන් සපිරි සියලුම විශේෂණ පද බොදු ගීත මාලාවන්හි යෙදී ඇති අයුරු සුවිශේෂී ය. මෙලෙස බුදුන් වහන්සේගේ පා පියුම් ගීතයෙන් වැඳ නමස්කාර කරන්නේ මෙසේ ය.

'නිර්වාණ ස්වර්ණ ද්වාරයෙන්
පිවිසූ තිලෝ සතුන්
සම්බෝධිරාජ පාද පත්ම
වන්දනා කරමි'

දෙවනුව වැඳ නමස්කාර කරන්නේ අමා මෑණී බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් ධර්ම රත්නයට යි. ගීතයේ සඳහන් සේ බුදුන් වහන්සේගේ ධර්මය දුක් සයුරෙන් එතෙර වන සත්වයන්ට නෞකාවක් බඳු ය. සයුරෙහි ඇති එකම ලුණු රසය මෙන් උන් වහන්සේ පෙන්වා දුන් ධර්ම, විනයෙහි ද ඇත්තේ එකම විමුක්ති රසයකි. මෙලෙස පන්සාළිස් වසක් මුළුල්ලේ ම විනය, සූත්‍ර, අභිධර්ම වශයෙන් තුන් පිටකයෙන් පෙන්වා දුන් ධර්මස්කන්ධය අසූහාරදහසකි. ඒ පෙන්වා දුන් සදහම් සෙවණෙන් බැහැර වන සියලු සත්වයන්ගේ සිත් සතන් දැවී තැවී යන්නේ රාග ආදී කෙලෙස් තාපයෙනි.

පෘතග්ජන සත්වයාගේ සිතෙහි කෙලෙසුන් එක්දහස් පන්සියයක් පවතින බව ද ධර්මයේ සඳහන් ය. 'පත්ලෙහි මඩ ඇති ළිඳෙහි ජලය මෙන් නොකැළඹෙන තෙක්' ඒ සිත පිරිසුදු ය. එය විටක අළු යට සැඟවුණු ගිනි පුපුරු සේ ය. මතු වන කෙලෙසුන්ගෙන් ලෝක සත්වයා විඳින දුක් වේදනා අපමණ ය. එය ගීතයෙන් 'අනන්ත වේදනා ජලේ ' යනුවෙන් දක්වා ඇති උපමාව කදිම ය. කෙනෙකුගේ කෙලෙසුන් යටපත් ව උසස් පුද්ගලයෙක් වීමට එතෙර විය යුත්තේ සදහම් නෞකාවෙනි.

එයට සවන් දී සාධු කාර නඟන්නාගේ මුවෙන් මානෙල් මල් සුවඳ විහිදුවන බව මනෝරථපූරණී නම් වූ අංගුත්තර අටුවාවේ ද සඳහන් ය. මිනිස්, දෙව්, බඹුන් පමණක් නොව ඒ උතුම් සරණ ගිය අසරණ වන සතුන්ට ද ලැබූ ධර්ම රත්නයේ පිහිට අනන්ත ය.

**නිර්වාණ ස්වර්ණ ද්වාරයෙන්**
**පිවිසූ තිලෝ සතුන්**
**සම්බෝධිරාජ පාද පත්ම**
**වන්දනා කරමි**
**ක්ලේශ තාපයේ**
**අනන්ත වේදනා ජලේ**
**නෞකාව දම් අමා වඳිමි**
**නමා නළල් තලේ**
**දෑග සව් රහත් බුදුන්**
**මා සිතින් පුදා**
**වන්දාමි සඟ රුවන් ගඳින්**
**මලින් බැතින් පුදා**

ගායනය
**මහාචාර්ය සනත් නන්දසිරි**
ගී පද රචනය
**ආචාර්ය අජන්තා රණසිංහ**
සංගීතය
**මහාචාර්ය සනත් නන්දසිරි**

චම්පා නුවර ගග්ගරා පොකුණෙහි මැඬියන් දහම් දෙසන හඬින් දෙව් ලොව උපත ලැබූ බව විමානවත්ථු ප්‍රකරණයෙහි ද දක්වා ඇත. ලක්දිව කුඹල් තිස් පව්වෙහි විසූ පන්සියයක් පමණ කිරි වවුලන්ට දහම් හඬ ඇසී සතුටු සිතින් උපත ලැබුවේ මිනිස් ලොව ය. දෑස් නොපෙනන අඳ ගැරඬියෙකු සදහම් හඬින් මිනිස් ලොව ඇමැති කුලයක උපත ලැබූ බව ද ධර්මයේ සඳහන් ය. ඒ උතුම් සදහම් සුවයෙන් සසර කතරෙන් එතෙරෙ ව සතර මඟ, සතර ඵලයන්ට පැමිණ නිවන් සුවයෙන් සැනසුණු පිරිස අපමණ ය. බුද්ධ රත්නය මෙන්ම ධර්ම රත්නය ද නමඳින පිළිවෙත ගෞරව බහුමානයෙන් ගීතයෙන් පසක් කරන්නේ 'නමා නළල් තලේ' යනුවෙනි.

**ක්ලේශ තාපයෙන්**
**අනන්ත වේදනා ජලේ**
**නෞකාව දම් අමා වඳිමි**
**නමා නළල් තලේ**

තෙරුවන් නමදින නිවැරැදි පිළිවෙත බුද්ධ , ධම්ම, සංඝ යනුවෙන් ගීතයෙන් ඉස්මතුවන්නේ පියගැට පෙළක් සේ ය.

මෙලෙස තෙවනුව වැඳ නමස්කාර කරන්නේ මහා සංඝ රත්නයට යි.

නිවනට පමුණුවන සුන්දර ප්‍රතිපත්තියක් පුරන උන්වහන්සේලාගේ ගුණ අපමණ යි. ඒ දහස් ගණන් සඟ පරපුර අදත් බොහෝ බෞද්ධ රටවල පිළිවෙත් පුරන්නේ බොදු සිත පුබුදු කරමිනි. බුදුන් වහන්සේගේ දකුණු පසින් වැඩසිටින්නේ ප්‍රඥාවෙන් අග්‍ර වූ සැරියුත් තෙරණුවෝ ය. බුදුන් වහන්සේගේ වම් පසින් වැඩසිටින්නේ ඍද්ධිමතුන් අතුරෙන් අග්‍ර වූ මුගලන් තෙරණුවෝ ය. මෙලෙස අතීත, වර්තමාන, අනාගත වශයෙන් පැවැත එන්නා වූ, ශීලයෙන්, ගුණයෙන් බබළන ඒ ආර්ය මහා සංඝරත්නය මලින්, සුවඳ දුමෙන් හද බැතියෙන් වැඳ නමස්කාර කරන්නේ මෙසේ ය.

**දෑග සව් රහත් බුදුන්**
**මා සිතින් පුදා**
**වන්දාමි සඟ රුවන් ගඳින්**
**මලින් බැතින් පුදා**

ජම්මිකා ප්‍රබෝධනී වැලිකල

06 පිටුවෙන්...

## ලාභයෙහි දැඩි ලෝභය...

'ස්වාමීනි, සාල් නැළියක් වටියි' කීවා

'දරුව පන්සියයක් අසුන් එක් සාල් නැළියක් වටින්නේ නම්, සාල් නැළියක් කෙතෙක් අගනේ ද?'

'ස්වාමීනි, යොදුන් දෙලොසක් සහිත අතුල් නුවර සහ යොදුන් තුන්සියයක් පිටි නුවර සමග බරණැස් රාජ්‍යම එකම සහල් නැළියකට අගනේ' යැයි වත්තක්කයා පිළිතුරු දුන්නා.

ඒ අසා අමාත්‍ය මණ්ඩලය ඔහුටත් ගර්හා කර 'අප මෙතෙක් කල් දැන සිටියේ බරණැස් නුවර රාජ්‍ය අනර්ඝ ය. මිල කළ නොහැකි ය කියා යි. එහෙත් මේ සා මහත් රාජ්‍යයක් එකම සහල් නැළියකට මිල වුණා.' යි කියමින් අත්පොළසන් දෙමින්, සිනාසෙමින් රජුටත් එම පුද්ගලයාටත් අපහාස තින්ද වන ආකාරයට කලබල හැසිරුණා.

එයින් රජ්ජුරුවෝ මහත් ලජ්ජාවට පත්ව ඒ අඥාන ලෝභී වූ පුද්ගලයා නුවරින් පිටුවහල් කොට නැවතත් මහ බෝසතාණන් ම වත්තකු තනතුරේ තැබුවා. බෝධි සත්ත්වයන් ද එතැන් පටන් සාධාරණ මිල ගණන් කියමින් භාණ්ඩාගාරයත්, රජ්ජුරුවනුත් ආරක්ෂා කර ගනිමින් රජුට සේවය කළා.

ශාස්තෘ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා 'ආනන්ද ස්ථවිරයෙනි, මේ අඥාන වූ උදායි ස්ථවිරයා මා හට ලාභයේ හානි කළේ දැන් පමණක් නොවේ. පෙරත් තමා අනුවණ බැවින් රාජ්‍ය පවා නැතිවන්නට ගියා" යි කියමින් තණ්ඩුලනාළි ජාතක දේශනය නිමවා වදාළා.

ඒ සමයෙහි ගම්වැසි අඥාන වත්තකු පුරුෂයා දැන් මේ ලාළුදායි ස්ථවිර යි නුවණැති වත්තකු පුරුෂයා නම් ලෝකස්වාමී වූ මම්ම නො වේදැ'යි තමන් වහන්සේ දක්වා වදාළා.

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

### බිනර පුර අටවක

අගෝස්තු 25 අඟහරුවාද අපරභාග 12.22න් පුර අටවක පෝය ලබා 26 බදාදා පූර්වභාග 10.39 න් ගෙවේ.

අඟහරුවාද සිල්

### බිනර පුර පසළොස්වක

සැප්තැම්බර් 01 අඟහරුවාද පූර්වභාග 09.39 න් පසළොස්වක පෝය ලබා 02 බදාදා පූර්වභාග 10.51 න් ගෙවේ. අඟහරුවාද සිල්.

### බිනර අව අටවක

සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා පූර්වභාග 02.06 න් අව අටවක පෝය ලබා 11 සිකුරාදා පූර්වභාග 03.35 න් ගෙවේ. බ්‍රහස්පතින්දා සිල්.

### බිනර අමාවක

සැප්තැම්බර් 16 බදාදා අපර භාග 07.56 න් අමාවක ලබා 17 බ්‍රහස්පතින්දා අපරභාග 04.30 න් ගෙවේ. බ්‍රහස්පතින්දා සිල්.

## කවරයේ කතාව



බරණැස පටන් උරුවෙලාව තෙක් පිහිටි මාර්ගයේ වඩිනා බුදු රජාණන් වහන්සේ මහා වනයේ පිහිටි කැප්පෙටියා ලැහැබක් දැක එහි රුකක් මුල වැඩ හුන් සේක.

ඒ මොහොතේ සිය බිරියන් හා භද්‍රවර්ගිය කුමරුවෝ එම වන ලැහැබෙහි ප්‍රීතියෙන් ඇවිද්දෝ ය.එහිදි එක් ස්ත්‍රියක නැති කුමරුවෙකු නගර සෝබනිය කැඳවා වනයෙහි ඇවිද ගියේ ය. එහිදි එම ස්ත්‍රිය කුමරු මගහැර ඔහුගේ වස්තුව රැගෙන පළා ගියා ය.කුමරුහු ඇය සොයමින් ඇවිද යන අතර මඟ භාග්‍යවතුන් වහන්සේ දැක පැමිණ ස්ත්‍රිය පිළිබඳ විමසූහ.

"දරුවනි, තමන් සොයා ගැනීම වඩා උතුම් ද නැතහොත් ස්ත්‍රියක සොයා යෑම වඩා උතුම් දැයි බුදු රජාණන් වහන්සේ ඇසූ සේක.ස්වාමීනි අපි අපම සොයන්නේ නම් ඒ සෙවීම උතුම් යැයි ඔවුහු උත්තර දුන්හ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දාන කතා ශීල කතාදී පිළිවෙල කතායෙන් අවවාද අනුශාසනා කළ සේක.එය ඇසීමෙන් ඔවුනට දහම් ඇස පහළ වූ අතර බුදු රජාණන් වහන්සේ ඒහි භික්ෂු සම්පත්තියෙන් ඔවුන් පැවිදි උපසම්පදා කළ සේක.

**වසන්න**

## පිහිට පතයි

අංක 320/ඒ මහගම හොරම්පැල්ල මිනුවන්ගොඩ යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. පී. සී. කුමුදුනී වීරතුංග යන අය දරුණු වකුගඩු රෝගයෙන් පීඩා විඳින බව කියයි. වයස අවුරුදු 56ක් වන තිදරු මවක් බව ද කියයි. කොළඹ ජාතික රෝහලේ වකුගඩු පිළිබඳ විශේෂඥ වෛද්‍ය ඒ. එල්. එම්. නසාර් මහතාගේ වෛද්‍ය නිර්දේශය අනුව "ඕ" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව කියයි.

පරිත්‍යාගශීලියෙක් වේ නම් 0771332088 හෝ 0779041516 දුරකතනයෙන් වැඩි විස්තර විමසිය හැකි බව ද කියයි.

**අයිවන් නිශ්ශංක – දිවුලපිටිය සමූහ**

සුදස්සී මාවත, හිත්තටිය නැගෙනහිර මාතර පදිංචි ලියනගමගේ පියරත්න යන අය හෘද රෝගී තත්වයෙන් පෙළෙන බව කියයි. කරාපිටිය රෝහලේ හෘද රෝග විශේෂඥ වෛද්‍ය එච්. ඩී. සමරසිංහ මහතා ඉතා ඉක්මනින් බයිපාස් ශල්‍ය කර්මයක් කරන ලෙස නිර්දේශ කර ඇති බව ද කියයි.

එම ශල්‍ය කර්මය සඳහා රුපියල් ලක්ෂ අටකට වැඩි මුදල් ප්‍රමාණයක් වැය වන බව ද ස්ථිර රැකියාවක් හෝ වෙනත් ආදායම් මාර්ගයක් නොමැති ආර්ථික අපහසුතාවෙන් ජීවත්වන තිදරු පියෙක් වන ඔහුට එවැනි මුදලක් ඉක්මනින් සොයා ගැනීම අපහසු වී ඇති බව ද කියයි.

පරිත්‍යාශීලියෙක් වේ නම් මාතර සමෘද්ධි බැංකුවේ එස්. එන්. නයනා තිල්මිණී ගිණුම් අංක 19/1648 යොමු කරන ලෙස කියයි.

**වකුගඩුවක් වහාම අවශ්‍යයි**

**$A^+$ හෝ $O^+$ වකුගඩුවක් පරිත්‍යාග කිරීමට කැමති පරිත්‍යාගශීලියකු පහත අංකයට කාරුණිකව අමතන්න.**

**077-4724151**

**සබ්බ දානං ධම්ම දානං ජිනාති**
**සියලු දානයන්ට වඩා ධර්ම දානය උතුම් ය**



**ධර්ම දානයේ කුසලය මෙලොවදීම අත් දකින්න ඔබට මාහැඟි අවස්ථාවක්**

හරවත් දහම් කරුණුවලින් සුපෝෂිත නව විශේෂාංග සමඟින්

**බුදුසරණ**

**පුවත්පත, විහාරස්ථාන,පාසල්,දහම් පාසල් වෙත බෙදා දීමේ පුණ්‍යකර්මය උදෙසා සැදැහැති ඔබට ද දායක විය හැකිය**

**මේ උතුම් පින්කමට ඔබට අවශ්‍ය බුදුසරණ පුවත්පත් කලින් වෙන්කරවා ගන්න**

**විමසීම් :**

**0112 429378 - දිනේෂ් | 0112429381 - චම්පා**

# පත්බේරියේ විමලඤාණ නා හිමි



**රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළයට අයත් පත්බේරිය ගම් පියසේ විසූ ජයසිංහ මුදියන්සේලාගේ උක්කුබණ්ඩාර නිලමේතුමාගේ සහ මනම්පේරි මුදියන්සේලාගේ පොඩිහාමු මන්පේරි මැණිකේ මහෝපාසිකා මාතාවගේ පුත්‍ර රත්නයක් ලෙස 1949 අගෝ. 20 වැනි දින පත්බේරියේ විමලඤාණ නා හිමියෝ ජන්ම ලාභය ලැබූහ. ගිහි කල ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ පත්බේරිය රජයේ පිරිමි පාසලින් සහ නාරද මහා විද්‍යාලයෙනි.**

කුඩා කල සිට ම ඉතා සැදැහැයෙන් ක්‍රියා කළ හෙයින් 1960 දෙසැම්බර් 30 වැනිද කිරුළපන ශ්‍රී පූර්වාරාමයේ දී උතුම් වූ ප්‍රව්‍රජ්‍යා භාවයට පත් වුණි. ආචාර්යපාදෝත්තමයාණන් වහන්සේලා වූයේ සිරිලක පහළ වූ ධර්ම විනයධර අග්‍ර ගණ්‍ය විද්වත් යතිවරයන් වහන්සේ නමක් වූ රත්දැල්ලේ ශ්‍රී පඤ්ඤාලෝක අනුනාහිමි සහ තලාවිටියේ පේමාලෝක නා හිමි ය. රද්දැල්ලේ අනුනාහිමි සෙවනේ මූලික ධර්මවිනය භාෂා ශාස්ත්‍රය ප්‍රගුණ කළ පත්බේරියේ හිමි 1962 දී මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙනට ඇතුළත් වුණි. 1969 දී තත් විද්‍යෝදය මහ පිරිවෙනින් ස්‍යාමරාජ ත්‍යාගය ද, 1973 දී රාජකීය පණ්ඩිත උපාධිය ද ලැබී ය.

1970 ජූලි මස 08 වැනිද කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව වෙතින් අධිසීල සංඛ්‍යාත සුපරිසුද්ධෝප සම්පදාව ලැබූ පත්බේරියේ හිමි 1975 දී කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් විය. එමගින් ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධියත්, 1989 දී ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියත්, 1990 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත් ලැබී ය.

1977 දී අනුරාධපුර බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ සංස්කෘත භාෂාව පිළිබඳ කථිකාචාර්ය ධූරයට පත් පත්බේරියේ හිමියෝ තදත්තරව ගොකරැල්ල පොල්ගොල්ල ශාස්ත්‍රාරවින්ද පිරිවෙන් විද්‍යායතනයේත්, හොරණ විද්‍යාරත්න විශ්ව විද්‍යාල පිරිවෙනෙත්, හොරණ ශ්‍රී ධම්මරතන මහ පිරිවෙනෙත්, ගංගොඩවිල ශ්‍රී සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙනෙත් පරිවේණාචාර්යවරයෙකු ලෙස ක්‍රියා කළහ. 1992 දී බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පිරිවෙන් සිංහල භාෂා ආගමික සම්බන්ධීකරණ නිලධාරී ලෙසත්, 1999 දී අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂ ශාඛාවේ ගාලු දිස්ත්‍රික් පිරිවෙන් පරීක්ෂක ලෙසත්, වර්ෂ 2006 සිට 2010 දක්වා රත්නපුර දිස්ත්‍රික් පිරිවෙන් පරීක්ෂක ලෙසත් පිරිවෙන් අධ්‍යාපන සේවාවට සුවිශේෂී සේවාවන් රැසක් සිදු කළහ. ලංකාවේ සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අද්විතීය නාමයක් තැබූ පිරිවෙන් පරීක්ෂකවරුන් අතර පත්බේරියේ නාහිමියෝ ඉදිරියෙන් ම සිටිති.




මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව මගින් පත්බේරියේ නාහිමි වෙත රත්නපුර මහ දිසාවේ ප්‍රධාන සංඝ නායක පදවිය පිරිනැමුවේ පූර්වෝක්ත සේවාවන්ට ඉහළින් ම ප්‍රසාදය පළ කිරීමක් ලෙසයි. කිරුළපන ශ්‍රී පූර්වාරාමය ප්‍රමුඛ තදනුබද්ධ විහාරස්ථාන පහක විහාරාධිපතිත්වය උසුලන පත්බේරියේ විමලඥාණ නා හිමි වෙත මැතක දී තත් කෝට්ටේ මහා සංඝසභාව වෙතින් ම එහි අධිකරණ ලේඛකාධිකාරී පදවිය ද පිරිනමා තිබේ.

**ඌරුගමුවේ අස්සජී හිමි**



# පහන් සිතක කවි

## වඳිමි අම්මේ ඔබෙ දෙපා

මහා සමනල කන්ද මුදුනෙදි
පෙනෙන ඉර සේවය වගේ
සඳ සත්තක සොම්නසින් ඇය
හිනැහුණේ සමනොළ වගේ
ඔබේ ගුණ හරියටම අම්මේ
ගලන මහවැලි ගඟ වගේ
ලිහිණි හෙල ළඟ පා ගැටෙද්දී
සිතම බුදු පාමුල තබා
රිදුන පැරදුන වැටුණ හැම විට
මහා කරුණාවෙන් බලා
මහා ගිරි දඹ නගින අත්වැල
දොළොස් මහ පහනක් වුණා
මහා මළුවේ තබා නළලත
වඳිමි අම්මේ ඔබෙ දෙපා

**ලක්ෂිකා මද්දුම බණ්ඩාර**
මහව

## බුදුහිමි වැඩ සිටිති

දැක දැන හැඳින ගත් නො හැඳුනකම නෙතක
නො ඇළුණු නොම ගැටුණු වුව සුන්දර වතක
නොම වී මුළා පහසට සියුමැලි ගතක
බුදු හිමි වැඩ සිටිති හැම පිවිතුරු සිතක

විශ්වය පුරාවට ඉතිරෙන සත් දහමින්
ඔබෙ සිත සරසන්න දිරි ගනු මැන යහමින්
රැස් මාලා කදම්බය ඔබ වෙත එවමින්
පෙන්වයි පාර බුදු හිමි මොහඳුර නසමින්

**හේමාලී ලියනාරච්චි**
පානදුර

## මුළාවීම

බෝ මළුවේ පන්සිල් කියවෙද්දී
හැම ශනිදා දවසේ
කාටත් නො ඇසෙන්නට නොදැනෙන්නට ...
මදුරුන් බිම හෙළුවේ
බණ පොත් පෙට්ටිය මීයන් කපලා
අපරාධයක් වෙලා
මී කතුරක් තම අතින්ම හදලා ...
උන් ගෙල සිඳ දැමුවේ
මෝහෙන් පිරිලා අඳුරෙන් වැහිලා
වල්මත් වී සසරේ ...
මිනිසුනි බුදු මග යන්නේ කෙලෙසද
නිවන දුරයි වාගේ

**දම්මිණී ප්‍රේමචන්ද්‍ර ෆොන්සේකා**
මාතර

## සම්බුදු හිමි

තිලොවට තිලක වූ සම්බුදු රජු නිතර
මෙත් සිත පතුරුවා දෙසූ දම් කඳ නිතර
හිමියන් දෙසූ බුදු බණ පද ගුණ යතුර
ගත්තොත් හොඳයි අප මෙය සිත හට නිතර

**ඇතිමලේ සාගර හිමි**
සිළුමිණි ද්විභාෂා මූලික පිරිවෙන
පිළියන්දල



## ඇසළ සිරි

**මුනිඳු පුදන සෑය වඳින**
**කිරි වෙහෙරයි පුද බිමේ**
**දෙවොල අසල සිහිල සදන**
**බෝ මළුවෙදි සිත නිමේ**
**දෙව්ඳු පුදන පූජා වට්ටි**
**පෙළට ඇදෙන සමය මේ**
**එවැනි දසුන් නොදැක අපගෙ**
**කඳුළු වුණා ඇස් තෙමේ**
**සිතක බැතිය පුබුදු කරන**
**මිහිරි ඇසළ සමයනේ**
**වඳින පුදන සැමට පිහිට**
**සදනු මැනවි සුරිඳුනේ**

**මිරිජ්ජවිල සිරි දන්තනාරායන**
හම්බන්තොට

මෙවර ජයග්‍රාහී කවිය

## සැදැහැ සිත

හදේ උපන් මහ කරුණාවෙන් යුතුව
ඔටුන්න අතැර මැඳුරෙන් නික්මී බුදුව
ලෝ සත වෙත සෙත සලසන්නට සිතුව
අබිනික්මන් කළා කුමරුන් සිත නතුව

බුද්ධ ගයා වෙහෙරෙහි සුන්දර තැනෙක
සිලි සිලි නදින් හද සනසන බෝ මැඩෙක
වීරිය අදිටනින් යුතු නොසැලෙන සිතක
මරු පරදා බුදු විය ලෝක නායක

**ශ්‍රියානි සී උඩුගල** - පරගස්තොට

## කවි කිවිඳියනට සතර පෝදාට ම දහම් තුටු පඬුරු

**බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.**

**බුදුසරණ පහන් සිතක කවි** BCC

**සම්පූර්ණ නම** :- ....................................................

**ලිපිනය** :- ....................................................

**දුරකථන අංකය** :- ....................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා, පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**

සංස්කරණය
**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

# ලුම්බිණි විහාරයට වන්දනා නඩයක් පැමිණෙයි

**තිස් වසරක යුද්ධය මැද නාගදීපය රැකගත් නා හිමියන්ගේ කතාව**

**14 කොටස**

**සැතපීමට ගිය ද පදුමකිත්ති හිමියන්ගේ හිත දැඩි ලෙසින් පෑරී තිබුණේ පස්වරුවේ වූ සිදුවීමටය. තමන් පැමිණ පැය කිහිපයක් හෝ යන්නට කලින් එලෙසින් බැණ වැදීම නම් කිසිසේත්ම අනුමත කළ නොහැකි යැයි පදුමකිත්ති හිමියෝ කල්පනා කළහ.**

**නාගදීපයේ සිට පිරිවෙන් අධ්‍යාපන කටයුතු පිණිස අනුරාධපුර විමල ධර්මදූත මධ්‍යස්ථානයට වැඩම කළ නවදගල පදුමකිත්ති හිමියන්ට එහිදී විවිධ ගැටලුවලට මුහුණ පාන්නට සිදු විය. එහි නාහිමියන් ද කිසිවකුට නොදන්වා වෙනත් විහාරස්ථානයකට ගොස් තිබුණේ එහිදී සිදුවූ සිදුවීම් නිසා ය. පිරිවෙන් නිවාඩු සමයේ නාගදීපයට වැඩම කළ පදුමකිත්ති හිමියන් කිළිනොච්චියේ ලුම්බිණි විහාරයට වැඩම කරන්නට සූදානම් වන විටම අනුරාධපුර විමල ධර්මදූත මධ්‍යස්ථානයේ හිමියන්ගෙන් නාගදීපයේ නා හිමියන්ට ලිපියක් ලැබුණි.**

ලිපිය කියවන්නට වූ නා හිමියන්ගේ නළල රැලි වැටෙන්නට විය. "යන තැන ලෙඩ ගොඩයි..." කියමින් නා හිමියන් පදුමකිත්ති හිමියන්ට දෙස් පවරන්නට විය.

"යනව.. යනව, එතනවත් වනසන්නෙ නැතුව ඉන්නවා," කියූ ධම්මකිත්ති නා හිමියෝ ආවාසයට වැඩම කළහ. පදුමකිත්ති හිමියෝ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයට වැඩම කළහ.

එහි විහාරාධිකාරි ධුරය දැරුවේ ධම්මානන්ද නම් හිමි නමකි. උන් වහන්සේ පදුමකිත්ති හිමියන් පැමිණි විගසම තම දේශනය පටන් ගත්හ.

"මෙතන වැඩ කරගෙන මම කියන විදිහට ඉන්න ඕන, කලින් හිටපු උන්නාන්සෙ මට ඉහළින් වැඩ කරන්න ගිහින් මම එළවල දැම්ම, අන්න දැන් වෙන පන්සලක ඉන්නව"

"මම ආවෙ කාගෙවත් වැඩ කරන්න නෙමෙයි, නායක හාමුදුරුවො කියපු නිසා පන්සල බලාගෙන ඉන්නයි මම ආවෙ, ඒකට උදවු කරන්න පුළුවන්, ඒ වුණාට කාගෙවත් වැඩපළ කරන්න මට බැහැ." පදුමකිත්ති හිමියෝ ද පිළිතුරු දුන්හ. එතැනින් කතාබහ නැවතුණු අතර ධම්මානන්ද හිමියන් පදුමකිත්ති හිමියන්ට කාමරයක් ලබා දුන්හ. එහි මඳ වේලාවක් සිටි පදුමකිත්ති හිමියෝ බෝමළුවේ සක්මන් කරමින් සිටි අතර තරමක් රෑ බෝවී එන විටම නාගදීපය බලා යන වන්දනා නඩයක් පැමිණි අතර උතුරේ කලබලකාරී තත්ත්වය මත ඔවුහු රාත්‍රියේ ගමනට අකමැති වූහ.

වන්දනාකරුවන්ගේ නඩේ ගුරා පදුමකිත්ති හිමිගෙන් විස්තර විමසී ය.

"නාගදීපයේ කිසි ප්‍රශ්නයක් නැහැ, නායක හාමුදුරුවන්ට ඉහළින් කවුරුත් වැඩ කරන්න යන්නෙ නැහැ." පදුමකිත්ති හිමියෝ විස්තර කළහ. විනාඩි 10කට වැඩි වේලාවක් වන්දනා නඩය සමඟ පදුමකිත්ති හිමියෝ කතා කරමින් සිටියහ. එතැනට පැමිණි



විහාරාධිකාරී ධම්මරතන හිමියෝ පදුමකිත්ති හිමියන්ට බැණ වැදුණාහ.

"මෙතන කයිය ගහන්නද ආවෙ, පන්සලේ වෙන වැඩ නැද්ද?"

ධම්මරතන හිමියන්ගේ ඒ දෝෂාරෝපණයට වන්දනා නඩයේ සිටි අය තුෂ්නිම්භූත වූහ. මඳක් නිහඬව පසෙකට වූ පදුමකිත්ති හිමියෝ යළිත් පැමිණ නඩේ ගුරා හමු විය.

"හෙට උදේම මාත් එනව ඔයාලත් එක්ක නාගදීපයේ යන්න, අර තියෙන්නෙ මගේ කාමරේ උදේට මට කතා කරන්න"

"එහෙමයි හාමුදුරුවනේ, අපි පාන්දර 5ට විතර යනවා, මම කතා කරන්නම්"

නින්දට ගිය ද පදුමකිත්ති හිමියන්ගේ හිත දැඩි ලෙසින් පෑරී තිබුණේ පස්වරුවේ වූ සිදුවීමටය. තමන් පැමිණ පැය කිහිපයක් හෝ යන්නට කලින් එලෙසින් බැණ වැදීම නම් කිසිසේත්ම අනුමත කළ නොහැකි යැයි පදුමකිත්ති හිමියෝ කල්පනා කළහ.

'මේ පන්සලට ඇවිත් පැය 24ක් වත් මට ඉන්න ලැබුණේ නැතෙ, හෙට පාන්දර වන්දනා නඩෙත් එක්ක මම යනවා'

අලුයම 'හාමුදුරුවනේ' යනුවෙන් කවුදෝ කතා කරනවා උන් වහන්සේට සිහිනෙන් මෙන් ඇසුණි. එහෙත් උන් වහන්සේ අනෙක් පසට හැරී සැතපුණේ තද නින්දේ පසු වූ නිසාය.

පසුදිනම පදුමකිත්ති හිමියන් අවදි වන විට හොඳටම එළිය වැටී තිබුණි. ඒ වන විටත් වන්දනා නඩය පිටත්ව ගොසිනි. සිහිනෙන් මෙන් ඇසුණේ තමන්ට කතා කළ හඬ බව පදුමකිත්ති හිමියන්ට තේරුම් ගියේ එවිටය. 'පැය 24ක්වත් මට මේ පන්සලෙත් ඉන්න බැරි වුණානෙ' යැයි යළිත් සිතමින් උන් වහන්සේ නාගදීපයට වැඩම කිරීමට සූදානම් වූහ. කෙසේ වුවත් භාරකාර හිමියන්ට දැනුම් දී යාම කළ යුතු යැයි සිතූ පදුමකිත්ති හිමියෝ උන් වහන්සේ සොයා ලැගුම් ගෙට වැඩම කළද උන් වහන්සේ එහි නොවූහ. දාන ශාලාව සොයා වැඩම කළ උන් වහන්සේ දුටු ධම්මානන්ද හිමියෝ ආ උන්නාන්සෙ වඩින කල් හිටියෙ, පරක්කු නිසා මම වළඳන්න ගත්තා, උන්නාන්සෙ වළඳන්න මෙන්න පිඟාන' යැයි පැවසූහ.

"එපා හාමුදුරුවනේ, මම ආපහු නාගදීපෙට යනවා, ඔබ වහන්සේට කියලා යන්නයි ආවෙ"

"මොකක්..... උන්නාන්සෙට පිස්සු ද? කොහේවත් යන්න එපා, මොනවද වෙන්න ඕන කියන්න" දානය වැළඳීම පසෙක තැබූ ධම්මානන්ද හිමියෝ පදුමකිත්ති හිමියන් දෙසට වැඩම කළහ.

"නැහැ, හාමුදුරුවනේ මට මුකුත්ම වෙන්න



ඕන නැහැ..." කියූ පදුමකිත්ති හිමියන් කිළිනොච්චියේ ලුම්බිණි විහාරයෙන් පිටවිය. නාගදීපයෙන් ගොස් පැය 24ක් යාමටත් පෙර පදුමකිත්ති හිමියන් ආපසු වැඩම කරනු දුටු ධම්මකිත්ති හිමියෝ ඇස් අයා ගෙන බලා උන්හ.

"මේ.. මොකෝ.."

ධම්මකිත්ති හිමියෝ වැල නොකැඩී ප්‍රශ්න කරන්නට වූහ.

"ඒ, උන්නාන්සෙ එක්ක මට ඉන්න බැහැ ලොකු හාමුදුරුවනේ, ගිය ගමන් මගෙන් වැඩ ගන්න හැදුවා, 'මට ඕන විදිහට ඉන්න බැරි අය එළවනවා' කිව්වා. කලින් හිටපු හාමුදුරුවොත් එළෙව්වා කිව්ව" යැයි පදුමකිත්ති හිමියෝ සියලු විස්තර පැවසූහ.

"ඒ ධම්මානන්දත් එක විදිහක් තමයි, කලින් උන්න උන්නාන්සෙත් පන්සලෙන් ගියේ එයාගෙ කෙරුවාව නිසා තමයි" තමාටම කියාගත් නා හිමියෝ" දැන් ඉතින් ඔතන හිටියා මදැයි ගිහින් මුහුණ කට හෝදගෙන ගිලන් පස එකක් හදව ගන්නව" කියමින් ආවාස ගෙයින් එළියට වැඩම කළහ.

දෙදිනක්ම ගෙවී ගියේ දැඩි අලසකමින් යුක්තව ය. හදිසියේම නා හිමියන් පදුමකිත්ති හිමියන් අමතා වදාළේ, "අපේ හිතවත් මහත්තයකුගෙ මළ ගෙයක් වෙලා අද රෑ කෝච්චියෙම යන්න ඕන, මාත් එක්ක උන්නාන්සෙත් යන්න ලෑස්ති වෙන්න ඕන" යනුවෙනි.

මතු සම්බන්ධයි

තාරක වික්‍රමසේකර

## සිරි සදහම් පැන විසඳුම්

බුදුසරණ

සතියේ ප්‍රශ්නය - 29

සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරු ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ" හිමිකර ගන්න.

සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ.

ජානේනහි මච්චේන කත්තබ්බං කුසලං බහුං

මෙහි අර්ථය සිංහල බසින් ලියා එවන්න

පිළිතුර : ........................................

නම : ........................................

නිවසේ ලිපිනය : ........................................

........................................

දුරකතන අංකය : ........................................

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම්, බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10




බුදුසරණ

# පාලි පාඩම

42 කොටස

සැකසුම
කොටනෙලුවේ පුඤ්ඤානන්ද හිමි



## මඞගල වග්ගො-පුබ්බණ්හසුත්තං

(අ.නි. තික නිපාතයේ මංගල වර්ගය 10 සූත්‍රය)

1. යෙ – යම්
2. භික්ඛවෙ – මහණෙනි
3. සත්තා – සත්ත්වයෙක්
4. පුබ්බණ්හසමයං – පෙරවරු කාලයේ/ උදේ
5. කායෙන – කයෙන්
6. සුචරිතං – යහපත්දේ/ සුචරිතයෙහි
7. චරන්ති – හැසිරෙති
8. වාචාය – වචනයෙන්
9. මනසා – මනසින්
10. සුපුබ්බණ්හො – සුභ උදෑසනක්
11. තෙසං සත්තානං – ඒ සත්ත්වයින්ට
12. මජ්ඣන්තික සමයං– දවල් කාලය
13. සුමජ්ඣන්තිකො – සුභ දහවලක්
14. සායන්හසමයං – සවස් කාලය
15. සුසායන්හො – සුභ සැන්දෑවක්

## මඞගල වග්ගො

(අ.නි. තික නිපාතයේ මංගල වර්ගය 01 සූත්‍රය)

### පුබ්බණ්හසුත්තං

'යෙ , භික්ඛවෙ, සත්තා පුබ්බණ්හසමයං කායෙන සුචරිතං චරන්ති , වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, සුපුබ්බණ්හො, භික්ඛවෙ, තෙසං
සත්තානං.
"යෙ, භික්ඛවෙ, සත්තා මජ්ඣන්තිකසමයං කායෙන සුචරිතං චරන්ති, වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, සුමජ්ඣන්තිකො, භික්ඛවෙ, තෙසං සත්තානං.
"යෙ , භික්ඛවෙ, සත්තා සායන්හසමයං කායෙන සුචරිතං චරන්ති, වාචාය සුචරිතං චරන්ති, මනසා සුචරිතං චරන්ති, සුසායන්හො, භික්ඛවෙ, තෙසං සත්තාන"න්ති.

### සිංහල තේරුම

"මහණෙනි, යම් සත්ව කෙනෙක් පෙරවරු කාලයෙහි කයින් සුචරිතයෙහි හැසිරෙත් ද, වචනයෙන් සුචරිතයෙහි හැසිරෙත් ද, සිතින් සුචරිතයෙහි හැසිරෙත් ද, මහණෙනි, ඒ සත්වයන්ට යහපත් පෙරවරු කාලයක් වෙයි.
"මහණෙනි, යම් සත්ව කෙනෙක් මධ්‍යහන කාලයෙහි කයින් සුචරිතයෙහි හැසිරෙත් ද, වචනයෙන් සුචරිතයෙහි හැසිරෙත් ද, සිතින් සුචරිතයෙහි හැසිරෙත් ද,
මහණෙනි, ඒ සත්ත්වයන්ට යහපත් මධ්‍යහන කාලයක් වෙයි.
"මහණෙනි, යම් සත්ත්ව කෙනෙක් සවස් කාලයෙහි කයින් සුචරිතයෙහි හැසිරෙත් ද, වචනයෙන් සුචරිතයෙහි හැසිරෙත් ද, සිතින් සුචරිතයෙහි හැසිරෙත් ද, මහණෙනි, ඒ සත්වයන්ට යහපත් සවස් කාලයක් වෙයි.

**මෙම පාඩම සතියේ සිකුරාදා සහ ඉරිදා රාත්‍රී 08.45 ට බෞද්ධයා රූපවාහිනී නාලිකාවේ ද (The Buddhist TV) සඳුදා සවස 03.30 ට බෞද්ධයා ගුවන් විදුලි නාලිකාවේ ද විකාශනය වේ. ඔබට පසුගිය වැඩසටහන් සියල්ල අන්තර් ජාලයෙන් ද නැරඹිය හැකි ය. ඒ සඳහා පිවිසෙන්න. www. the buddhistTV / Magadhi (මාගධී) හෝ kotaneluwe thero (කොටනෙලුවේ හිමි) යනුවෙන් සොයන්න.**

බුදු සරණ





## සිය ගණනින් මහ රහතන් වහන්සේ වැඩ සිටි

# පිළිකුත්තුව රාජ මහා විහාරය

**මුදුන් වෙන ඉර රශ්මිය සඟවා ගන්නට වෑයම් කරන අතු පතර විහිදී ගිය රුස්ස ගස්වල වියන හරි අපූරු ය.ඒ සෙවණ යට අතීත රජ දරුවන් මෙන්ම මහා රහතන් වහන්සේලාගේ පාද ස්පර්ශය ලැබූ වැලි මළුව අතීත අභිමානයට කදිම පරිසරයක් මවා ඇත්තේ ය.**

විහාර මළුවට ඉදිරිපස, ඈතට දිවෙන වෙල් යායත්, දකුණු පසින් ඇති පොල් වතු ද සශ්‍රීකත්වයේ අමිල සටහන් යැයි සිතේ. වම් පසින් ඒ සශ්‍රීකත්වයට නෑකම් කියන අභය වැව ද ,නැගෙනහිරින් රහතන් වහන්සේලාගේ ස්පර්ශයට පූජා වුණු ලෙන් සංකීර්ණ හා සුන්දර වන පියස ද දක්නට ලැබෙයි.මේ අතීතයේ උරුමය යළි යළිත් මතුවෙන ඓතිහාසික පිළිකුත්තුව රාජ මහා විහාර පින් බිමේ සීමා මාලකයයි.

අක්කර දෙසීයක පමණ භූමි භාගයක් පුරා ව්‍යාප්ත ව ඇති පිළිකුත්තුව රාජ මහා විහාරය ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලයට අයත් පින් බිමකි.

කොළඹ නුවර පාරේ ගම්පහ මිරිස්වත්ත හන්දියෙන් වතුරගම කිරිඳිවැල මාර්ගයෙන් කිලෝමීටර් හතරකුත්, ඉන්පසු පිළිකුත්තුව හන්දියෙන් වමට හැරී කිලෝමීටරයක පමණ දුරක් ගිය පසු මෙම පින් බිමට පැමිණිය හැකි ය.

නේක හැඩතල වලින් යුත් පර්වත හා ගල්කුළු සහිත උස්බිම් ප්‍රදේශයක් වන පිළිකුත්තුව පිළිබඳ ජනප්‍රවාදයේ ඇත්තේ ද විවිධ කතා පුවත් ය.

රජවරුන් ට පිළි සැපයූ ගම් පියස නිසා පිළිකොටුව,ආරච්චි කොටුව,මල් කොටුව,හාල්පන් කොටුව හා බිලි ගහ කොටුව යන පහ එකතු වී පිළිකොටුව යන්න පිළිකොත්තුව වී පසුව පිළිකුත්තුව වූ බව මෙම විහාර පින් බිමේ ඇති පුරාවිද්‍යා ඒකකයේ ආචාර්ය මුල්ලේගම සුමන හිමියෝ පවසති.

වළගම්බා රජතුමා වසර දාහතරයි



මාස හතක් සැඟව සිට සිය සේනාව සංවිධානය කළ එක් ස්ථානයක් වශයෙන් ද හැඳින්වෙන අතර රජුට පිළි සැපයූ ගම වශයෙන් ද, වළගම්බා රජුගේ බිසවගේ ආභරණ හා පිළි සඟවා තැබූ ගම වශයෙන් ද පිළිකුත්තුව පිළිබඳව ජනප්‍රවාදයේ එන තවත් මතයකි.

පිළිකුත්තුව විහාර පින් බිම වටා ඇති කටාරම් සහිත ලෙන් හා ස්වභාවික ලෙන් එකසිය දෙකක් පමණ ඇති අතර බ්‍රාහ්මීය අක්ෂර සහිත පුවරු ද දක්නට ලැබීම ඉතිහාසයේ සලකුණු වලට කදිම සක්ෂි ය.එමෙන්ම ස්වභාවික පොකුණු හා උමං මාර්ග ද තවමත් දක්නට ඇති දසුන් ය.පශ්චාත් නුවර යුගයේ දී නිර්මාණය වුණා යැයි සැලකෙන ලෙන් විහාර ගෙයත්, එහි ඇතුළත ජාතක කතා සිතුවම් ද අතීත රජ දරුවන්ගේ නිර්මාණ ප්‍රතිභාවට කදිම සාක්ෂි ය.අඩි විසිහයක් පමණ දිගින් යුතු සැතපෙන බුද්ධ ප්‍රතිමා වහන්සේ ත් අඩි හතක් පමණ උස හිටි පිළිම වහන්සේත්, ධ්‍යාන මුද්‍රාවෙන් නිර්මිත සමාධි පිළිම වහන්සේ ද විහාරය ඇතුළත සිත් නිවා සනහන දසුන් ය.

විශ්ණු හා නාථ දේව ප්‍රතිමා දෙකක් ලෙන් විහාරය තුළ තිබීමෙන් එකල දේව වන්දනාව ද විහාරය කේන්ද්‍ර කරගෙන සිදුකර ඇති බව සුමන හිමියෝ පෙන්වා දෙති.

පිළිකුත්තුව රාජ මහා විහාරයේ සුවිශේෂ කරුණක් බවට දක්නට ලැබෙන සිතුවමකි භික්ෂුණීන් වහන්සේලා ගේ සිතුවම.රහත් තෙරණින් වහන්සේලා දෙනමකගේ හා භික්ෂුණීන් වහන්සේලා දෙනමකගේ සිතුවම් මෙහි දක්නට ලැබෙයි. එය බුදු රජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවිකාවන් වන ඛේමා හා උප්පලවන්නා තෙරණිවරුන්ගේ නිරූපණයක් යැයි විශ්වාසයක් පවතී.එමෙන්ම ලෙන් විහාර යේ වියන තුළ නෙළුම් මල් තුන්සිය පනහක් පමණ සිතුවම ද නෙතට එක් කරනුයේ අපූරු දසුනක් ය.

විහාරය වටා ඇති බිතු සිතුවම් අතර එක් පසෙක සිවිලිම,ලෑලිවලින් නිමවා ඇති අතර, එහි රාශි දෙළහ සිතුවම් කර තිබීම පිළිකුත්තුව විහාරයේ දක්නට ඇති තවත් සුවිශේෂ කරුණක් ය.කෝට්ටේ යුගයේ ඉතා දියුණුවට පත් පිරිවෙන් අතරින් එකක් වන කෑරගල පද්මාවති පිරිවෙන පිළිකුත්තුවට ආසන්න ව පිහිටි නිසා භික්ෂූන් වහන්සේලා ථේරවාදී බුදු දහම ඉගෙනුමට අමතර ව ජ්‍යොතිෂ විද්‍යාව ද උගෙන ඇති බැව් මුල්ලේගම සුමන හිමියෝ සඳහන් කරති.

එමෙන්ම බදාම හා වර්ණ සකසා ගැනීම සඳහා ස්වභාවික ද්‍රව්‍ය යොදා ගෙන ඇති අතර ක්‍රි.ව 1834 දී මංගල හෙරියේ සිරියා නැමැති චිත්‍ර ශිල්පියා මෙහි බිතුසිතුවම් ප්‍රතිසංස්කරණය කළ බව ජනප්‍රවාදයේ සඳහන් තවත් කරුණක් ය.

ක්‍රි.ව 1874 දී නිර්මාණය කළ සිතුවම් ද පිළිකුත්තුව රාජ මහා විහාර පින්බිමේ දක්නට ඇති අතර වසර හාරසියයකට වඩා ඉපැරණි අක්කර ගණනක් පුරා පැතිර ඇති පුස් වැල ද ඒ අභිමානය නිහඬව මෙම පුණ්‍ය භූමියේ දරා සිටින බැව් දැක ගත හැකි ය. පිළිකුත්තුව රාජ මහා විහාර පින් බිමේ බෝධීන් වහන්සේ ලා දෙනමක් එක සමීපයේ වැඩ සිටින අයුරු දක්නට ඇති දුර්ලභ දසුනක් ය. අහස් කුසට එසැවී ගිය එක් බෝධීන් වහන්සේ නමක අතු පතර මනා ලෙස විහිදී ගොස් ඇති අතර එය 'කුමරි බෝධිය' නමින් ද අතු පතර විහිද නොමැති බෝධිය 'කුමර බෝධිය' වශයෙන් ද ජනප්‍රවාදයේ සඳහන් ව එන කරුණක් ය.

විහාරය ආසන්නයේ කටාරම් ලෙන විශාල ගල් දෙකක් එකට යා වීමෙන් නිර්මාණය වී තිබෙන අතර, එහි ඝ ණ්ඨාකාර හැඩයෙන් යුත් ස්තූපය දකින නෙතඟට දැනෙන්නේ අපමණ ශ්‍රද්ධාවකි.

පශ්චාත් නුවර යුගයේ දී නිර්මාණය කොට ඇති එය ගඩොල් භාවිතයක් නොකොට සියල්ල මැටියෙන් නිර්මාණය කර තිබීම ද අපූරු ය.ස්තූපයේ කොත වෙනුවට කරඬුවක් තැන්පත් කර තිබුණත් එය පසු කාලීනව නිධන් සොරුන්ගේ ගොදුරක් බවට පත්වීමේ අඳුරු සලකුණු තවමත් දක්නට හැකි ය.

පිළිකුත්තුව රාජ මහා විහාර පින් බිමේ දක්නට ඇති දැව පාලම ද සිත් ඇද ගන්නා තවත් දසුනක් ය.උමං ජල මාර්ගය විවෘතව පවතින ස්ථානයක් හරහා මෙම දැව පාලම ඉදිව ඇති අතර කැලෑ දෙල් දැවයෙන් යකඩ ඇණ රහිතව ක්‍රි.ව 1873 දී එය නිර්මාණය කර ඇති බැව් දැක ගත හැකි ය.

ඒ ආසන්නයේ දක්නට ඇති ලෙන තුළ ඇත්තේ දැවයෙන් නිර්මිත වූ දෝලාවකි.එය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් වහන්සේ පිළිකුත්තුව රාජ මහා විහාරයට ධර්ම දේශනාවක් සඳහා වැඩම කරවූ දෝලාව යැයි මුල්ලේගම සුමන හිමියෝ පවසති.

සිය ගණනක් රහතන් වහන්සේලා ගේ ස්පර්ශයෙන් හා අතීත රජදරුවන්ගෙන් පුණ්‍යවන්ත වූ පිළිකුත්තුව රාජ මහා විහාර පින් බිමේ හාත්පස ඇත්තේ ජාතියක අභිමානය ලියැවෙන නශ්ඨාව ශේෂයන් ය.

කටු කොහොල් පිරි ඝන කැලෑව මැද ඉහළට එසැවුණු පර්වත මස්ථකයෙහි මේ අභිමානය තවත් වසර ගණනක් අනාගතවාදීන් උදෙසා නිසොල්මනේ දරා සිටිනවා ඇත.

**වසන්ත ජයසිංහ ආරච්චි**

ජායාරූප
**සමන්ත වීරසිරි**

වර්ෂ 2020 ක් වූ අගෝස්තු 25 අඟහරුවාද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.